*Question, that the words proposed to be left out stand part of the Clause, put, and negatived.*

*Question, that those words be there inserted, put, and agreed to.*

*Question, that the Clause, as amended, stand part of the Bill, put, and agreed to.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

### CLAUSE 4.—(*Amendment of the Town Councils Ordinance*)

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

I move,

In page 2, leave out lines 14 to 19, and insert :

" (2) In determining for the purposes of this Ordinance the annual value of any premises to which the Rent Restriction Act applies, and in assessing the annual rent of such premises for the purposes of such determination, a Town Council shall not have regard to the provisions of that Act. ".

**අත්හැරීමට යෝජනා කළ වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.**

**අනික් වචන එතැනට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினு விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.*

*அந்தச் சொற்கள் இங்கே சேர்க்கப்பட வேண்டும் எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*வாசகம், திருத்தப் பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*4 ஆம் வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.*

*Question, that the words proposed to be left out stand part of the Clause, put, and negatived.*

*Question, that those words be there inserted, put, and agreed to.*

*Question, that the Clause, as amended, stand part of the Bill, put, and agreed to.*

*Clause 4, as amended, ordered to stand part of the Bill.*

### CLAUSE 5.—(*Amendment of the Village Councils Ordinance*)

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

I move,

In page 2, leave out lines 29 to 34, and insert :

" (2) In determining for the purposes of this Ordinance the annual value of any premises to which the Rent Restriction Act applies, and in assessing the annual rent of such premises for the purposes of such determination, a Village Council shall not have regard to the provisions of that Act. ".

**අත්හැරීමට යෝජනා කළ වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.**

**අනික් වචන එතැනට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினு விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.*

*அந்தச் சொற்கள் இங்கே சேர்க்கப்பட வேண்டும் எனும் வினு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வாசகம், திருத்தப் பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

5 ஆம் வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Question, that the words proposed to be left out stand part of the Clause, put, and negatived.*

*Question, that those words be there inserted, put, and agreed to.*

*Question, that the Clause, as amended, stand part of the Bill, put, and agreed to.*

*Clause 5, as amended, ordered to stand part of the Bill.*

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா திருத்தத்துடன் ஏற்றுக் கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendment.*

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Sir, I have an amendment. I move, to leave out "now" and at the end of the Question to add, "upon this day one year."

I have already given my reasons to the Hon. Minister. I think the Hon. Minister will not interpret this as an act of lacking in generosity towards him in this matter. While appreciating his intentions, the fact remains that until the Hon. Minister's measures take a concrete form we are unable to feel satisfied that the poor tenant in the city is going to get a satisfactory deal. That is why I am giving the Hon. Minister one year's time in which to get his officials to draft the necessary legislation to give a concrete form to the proposals which he says he has in mind for the benefit of the tenant. For that reason I move this amendment.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.

*seconded.*

"අත් හැරීමට යෝජනා කරන ලද 'now' කියන වචනය ප්‍රශ්නයේ කොටසක් හැටියට තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

"இப்பொழுது" எனும் சொல் வினாவின் பகுதியாக இருக்குமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

Question, "That the word 'now' stand part of the Question", put, and agreed to.

"කෙටුම්පත් පනත, සංශෝධිතාකාරයෙන්, දැන් තුන් වන වර කියවිය යුතුය" යන මුල් ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

"மசோதா, திருத்தப்பட்டவாறு இப்பொழுது மூன்றும் முறையாக மதிப்பிடப்படுமாக" எனும் மூல வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Main Question, "That the Bill, as amended, be now read the Third time", put, and agreed to.

කෙටුම්පත් පනත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

அதன்படி, மசோதா திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப் பெற்று நிறைவேற்றப்பட்டது.

Bill, as amended, accordingly read the Third time, and passed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත

## காணி அபிவிருத்தி (திருத்த) மசோதா

## LAND DEVELOPMENT (AMENDMENT) BILL

**කල් තබන ලද විවාදය නැවත දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදි. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 23.]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]**

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

நவம்பர் 23 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

" மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப் பிக்கப்படுமாக " [கௌரவ சீ. பீ. டி சில்வா].

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question.—[23rd November.]*

"That the Bill be now read a Second time."—[*The Hon. C. P. de Silva.*]

*Question again proposed.*

අ. භා. 4.41

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குரஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම් පතක් ගැන කිව්වාම සමහර විට කෙනෙකු මේක මේ රටේ ඉඩම් සංවර්ධන ව්‍යාපාර දියුණු කිරීමට, ආහාර හා වෙනත් වගාවන් දියුණු කිරීමට, ඉඩම් සංවර්ධන ආඥා පනතේ දැනට තිබෙන දුර්වලකම් නැති කිරීමට, වැරදි ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතක්ය කියා කල්පනා කරන්නට පුළුවනි. විශේෂයෙන්ම මේ පනත් කෙටුම් පතේ මූලික පරමාර්ථයක් හැටියට තිබෙන්නේ රජය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජනපදවල පදිංචි කරවා සිටින ගොවීන්ට ඒ ඉඩකඩම්වල අයිතිය හිමිකර දීමය කියා ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථා වේදී විස්තරයක් කළා. දැනට මේ ජනපද වල ඉඩම් කට්ටි ලබා ගෙන ඒවායේ පදිංචිව සිටින ගොවීන්ට ඉඩම අයිති නැත, ඒකෙ ලොකු දුර්වලකමක්, අසාධාරණයක් තිබෙනවාය, එමනිසා ඒ උදවියට ඉඩමේ ස්ථිර අයිතිය හිමි කර දීමේ වැඩ පිළි වෙළක් මේ සංශෝධන පනත් කෙටුම් පතින් ඉදිරිපත් කර තිබෙනවාය කියාත් ගරු ඇමතිතුමා කියන්නට යෙදුණා. නමුත් මේ නීති මාලාව කියවා ගෙන යන විට අපට පැහැදිලිව අවබෝධ වන්නේ කුමක්ද? ඉඩමේ අයිතිය සහතික කරන වාය කිව්වත් මේ නීති මාලාවේ ඇත්තේ ඉඩම අන් සතු කිරීමට කටයුතු කළ හැකි කුමන මාර්ගවලින්ද, අන් සතු කරන්නට පුළුවන්ද යන කාරණය පිළිබඳ ව වැඩ පිළිවෙළක් පමණයි. ඒ හැර ඇත්ත වශයෙන්ම ඉඩමේ අයිතිය ගොවියාට සහ තික කිරීමේ තත්ත්වයක් නැහැ. ඉඩම උකසකට යට කරන්නේ කොහොමද, ඉඩම විකුණන්නට පුළුවන්ද, ඉඩම ඇප යක් හැටියට තබා තිබෙනවා නම් විකුණන් නට පුළුවන්ද, උකසකට යට කර තිබු ණොත් විකුණන්නට පුළුවන්ද ඔය ආදී වශයෙන් කල්පනා කර මේ නීතිය පිළියෙළ කර තිබෙන බවයි අපට පෙනෙන්නෙ. මේ පනත් කෙටුම්පතේ තිබෙන කොන්දේසි යටතේ හරියාකාරව ක්‍රියා නොකළොත් ඉඩම් කොමසාරිස්වරයාට හෝ දිසාපතිවර යාට හෝ ඉඩමක් තහනම් කරන්නට පුළු වනි; අන් සතු කරන්නට පුළුවනි. ඒ අනුව ප්‍රධාන වශයෙන් මේ පනත් කෙටුම් පතේ ඉඩමක් අන් සතු කිරීමේ වැඩ පිළි වෙළක් තිබෙන බවයි අපට පෙනෙන්නෙ. දැනට තිබෙන නීතිය යටතේ ජනපදයක ගොවියකුගේ ඉඩමක් අන් සතු කරන්නට බැහැ. දැනට තිබෙන නීතිය යටතේ ජන පදයක ඉඩමක් ලබා ගෙන පදිංචිවී සිටින ගොවියකුට තමන් ජීවත්ව සිටින තෙක් ඒ ඉඩම වගා කරන්නට පුළුවනි. තමන් ඇවෑ මෙන් පවුලේ ඥාතිවරයින්ට අයත් වන අන්දමේ ලැයිස්තුවක් තිබෙනවා. පවුලේ ලේ උරුමයක් තිබෙන ගොවීන්ට අනුක්‍රම යෙන් ඉඩම් අයිති වෙනවා. ඒ මිසක් ඉඩම කොටස්වලට කැඩෙන්නෙ නැහැ. ඒ සඳහා දී තිබෙන සහතිකයෙන්ම ප්‍රකාශ වෙනවා එය අන් සතු වන්නෙ නැති බව. උරුමය අනුව එක ගොවියෙකුගෙන් තවත් ගොවි යෙකුට අයත් වෙනවා. එහෙත් මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

සංශෝධන පනතින් කර තිබෙන්නේ අන් සතු කරන ක්‍රමයක් ඇති කිරීමයි. මේම පනතේ ප්‍රධාන වශයෙන් ඇඳ කර තිබෙන්නේ එම නීතියයි.

මෙහි ඇතුළත් කර තිබෙන තවත් නීති අතර දඩ ගැසීමේ ක්‍රමයේ වෙනසකුත් ඇති කර තිබෙනවා. යම් ජනපදයක ඉඩම් කට්ටිකරුවෙක් තමන්ගේ කටයුතු හරියාකාර ඉටු කෙළේ නැත් නම් මෙතෙක් පැවති නීතිය නම් රුපියල් 100ක දඩයකට යටත් වීමයි. දැන් මෙම පනතින්, අයිතිවාසිකම් වැඩි කරන්නට යන පරමාර්ථයෙන් එම දඩය රුපියල් 500 දක්වා වැඩි කර තිබෙනවා. ඒ කෙසේ වුණත් මෙහි එක සහනයක් දී තිබෙනවා. එනම් 17 වන වගන්තියේ සඳහන් "අවසර පත්‍ර හා ප්‍රදාන පිට සතුකර දෙනු ලබන ඉඩම් ආරක්ෂා කිරීම" යන නීතිය ඇතුළත් කිරීමයි. ආණ්ඩුවට දැන් බලහත්කාරයෙන් ඉඩම් අල්ලාගන්න පුළුවන්. නමුත් ඇඳ ඇතිරිලි ටික විතරක් අල්ලාගැනීම තහනම් කර තිබෙනවා. ඒක සහනයක් හැටියට අප පිළිගන්න ඕනෑ. ඒ මොකද ? නිශ්චල චංචල දේපළත් සමග ඉඩමක් තහනම් කරන්න පුළුවන් වුණත් ඇඳ ඇතිරිලි ටික පමණක් තහනම් කරන්න බැහැ. අප ඉල්ලා සිටින්නේ ඇඳ ඇතිරිලි ටික පමණක් නිදහස් කිරීම නොවෙයි. ආණ්ඩුව විසින් ජනපද ව්‍යාපාර ඇති කිරීමේදී, රට සංවර්ධනය පිණිස ආහාර ද්‍රව්‍ය වගා කිරීමට මොන අන්දමේ පවුල්වලට ඉඩම් අයිතිය දිය යුතු ද යනුවෙන් පැහැදිලි ප්‍රතිපත්ති මාලාවක් සකස් කර ඒ අනුව ගොවීනට ඉඩම් දී ඒ ගොවීන් එම ඉඩම් වගාකරමින් සිටින තුරා වගාකිරීමේ සාධාරණ අයිතිය වෙනස් නොවන අන්දමට කටයුතු කළ යුතුයි.

දැනට ඔය ඉඩම් දී ඇති සහතිකයේ තිබෙනවා, වගා කටයුතු හේතුකොටගෙන සිදු වූ ණය තුරුස් සඳහා බැංකුවලට හෝ පුද්ගලයන්ට ඉඩම් උකස් කිරීම පුළුවන් කියා. බැංකුව ගත්තත් පුද්ගලයන් ගත්තත් සිදු වන්නේ අන් සතු වීමයි. බැංකුව ඉඩම අයිතිකර ගත්තත් බැංකුවේ නිලධාරීන් ඒවා වගා කරන්නෙ නැහැ. විකිණීමෙන් තව කෙනෙකුට පවරන එකයි බැංකුවෙන් කරන්නෙ. ඔය අන්දමට බලන විට අන් සතු වන මෙම ප්‍රතිපත්තිය උඩ ගොවි යාට තිබෙන ස්ථිර පදනම වෙනස් වී යනවා. මේක තමයි ධනපති ක්‍රමයේ තිබෙන ප්‍රධාන අංගය. ධනපති ක්‍රමයේ මූලික පරමාර්ථයත් ඒකයි; ධනපති ක්‍රමය රැඳී තිබෙන්නෙත් ඒ ප්‍රතිපත්තිය උඩයි. දුර්වල තැනැත්තාගේ දේපළ ටික ගිලගන්න පුළුවන් විධියට සැලැස්මක් ඇති කරනවා. එතකොට තමයි ධනපති ඉඩම් හිමියන් ඇති වන්නෙ. ඒ නිසා මෙසේ ඉඩම් අන් සතු කිරීමේ වැඩ පිළිවෙළ ධනපති ක්‍රමයේ මුල් පියවරක් හැටියට අපට හිතා ගන්න පුළුවන්. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ජනපදවල පදිංචි වී සිටින පවුල්වලින් ඒ ඉඩම් අයිතිය අන් සතු කිරීමට නීති සකස් කිරීම ධනපති ක්‍රමය අනුව ඉඩම් වගා කිරීමේ වැඩ පිළිවෙළට මුල පිරීමක් හැටියට අපට හිතාගන්න පුළුවන්. මෙය ධනපති ක්‍රමය තහවුරු කිරීමට ගෙනෙන ලද සංශෝධනයක් හැටියට අපට පිළිගන්න සිදු වී තිබෙනවා. එසේ නැතිව වැඩ කරන ගොවියාගේ අයිතිවාසිකම් සහතික කිරීමට ගන්නා උත්සාහයක් වශයෙන් අපට මේ සංශෝධනය පිළිගන්නට බැහැ. ඉඩම් සංවර්ධන කොමිෂන් සභාවේ නිගමනයන් අනුව ඇතැම් තහනම් නීති මේ සංශෝධන වලට ඇතුළත් කර තිබෙන බව ඇත්තයි. නිදහසේ තමන්ට වුවමනා කරන කෙනෙකුට මේ ඉඩම් විකුණන්නට බැරි අන්දමේ තහනමක් දමා තිබීම ගැන මා සතුටු වෙනවා. එහෙත් පළමුවෙන් යෝජනා කර තිබුණේ කිසිම සීමා කිරීමක් නැතිව තමන්ට වුවමනා කෙනෙකුට තමන්ගේ ඉඩම විකුණා ගැනීමට ඉඩ තැබීමටයි. ලොකු ධනපතියන්ට ඉඩම් ටික ගිළ ගන්නට පුළුවන් වන ආකාරයට නීති පණවන්නටයි මුලින් අදහස් කර තිබුණේ. එහෙත් මේ පනතින් සීමාසහිත අන්සතු කිරීමක් ඇති කර තිබෙනවා. මේ පනතේ 19 වෙනි වගන්තියේ ඒ ඡේදය යොදා තිබෙන්නේ මෙහෙමයි :

"ආ. ලංකාවේ කෘෂිකම් හා කාර්මික ණය දෙන නීතිගත සංස්ථාව හෝ මහජන බැංකුව හෝ ලංකා රජයේ උකස් බැංකුව හෝ ලියාපදිංචි කළ සමිතියක් හෝ වෙනත් නියමිත ආයතනයක් නොවන වෙන යම් තැනැත්තකුට ඒ සන්තක ඉඩම උකස් නො කළ යුතු ය."

මීට ඉස්සර මේ ඉඩම් කාටවත් උකස් කරන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා ඉඩම වැඩ කරන ගොවි පවුලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සහතිකයි. කොයිතරම් ණය තුරුස් තිබුණත්, කොයිතරම් දුප්පත් වුණත් ඉඩම අන්සතු වෙන්නෙ නැහැ. තමන්ගේ ජීවිකාව කර ගන්නට තිබෙන ඉඩමට ඒ අනුව සහතිකයක් තිබුණා. එහෙත් දැන් ඒවා අන්සතු කරන්නට පුළුවන්වන අන්දමට නීතිය සංශෝධනය කර තිබෙනවා. මේ නිදහස හොඳ ලකුණක් හැටියට අපට පෙන්වා දෙන්නට උත්සාහ කරන නමුත් අද ගොවි ජනපදවල ණය බරින් ජීවත්වන ගොවීන් දෙස බලන විට මේ සහනය සැලසීම ඉඩම් සංවර්ධන වැඩ පිළිවෙලට ආධාරයක් වෙයි කියා හිතන්නට අමාරුයි. ඒ නිසා මෙය ගොවියාගේ දියුණුව සඳහා සකස්වූ සංශෝධනයක් වශයෙන් අපට සලකන්නට පුළුවන්කමක් නැහැ.

මේ පනතේ "අනු ප්‍රාප්තික" යන වචනයට දී තිබෙන අර්ථ නිරූපනයෙන් ඉඩම්වල අයිතිය සීමා කර තිබෙනවා. ධනපති ක්‍රමයේ තිබෙන අයිතිය සම්පූර්ණයෙන්ම ඒ මගින් දී නැති බව අපි පිළිගන්නවා. කෙනෙකුට තිබෙන අයිතියක් ඔහුගේ පරම්පරාවට අයිතිවන නීතියක් ධනපති ක්‍රමයේ නැහැ. තමන්ට ඕනෑ කෙනෙකුට තමන්ගේ අයිතිය පවරන්නට පුළුවනි. ඒ වගේම තමන්ගේ අයිතිය තමන්ට ඕනෑ කෙනෙකුට තෑගි කරන්නට හෝ විකුණන්නට අයිතිය තිබෙනවා. ඒක තමයි, ධනපති ක්‍රමයේ නිදහස් අන්දමේ පෞද්ගලික අයිතියය කියන්නේ. එහෙත් තමන්ගේ කැමැත්තෙන් අන්සතු කළ හැකි ආයතනවල නම් ලැයිස්තුවක් මේ සංශෝධනයේ යොදා තිබෙනවා.

මා කලින් මතක් කළාක් මෙන් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් ලබා ගෙන රටට සේවය කරන ගොවියකු වරදක් කළ විට ඔහුට ගසන දඩ මුදල රුපියල් 100 සිට රුපියල් 500 දක්වා වැඩි කිරීමට මේ පනතින් අදහස් කරනවා. ඒ විගේම ඔහුගේ ඉඩම තහනම් කරන්නටත් බලය තිබෙනවා. එහෙත් ගොවීන්ට දෙන පොරොන්දු ඉටු නොකරන දිසාපතිවරුන්, ඉඩම් කොමසාරිස් වැනි නිලධාරීන්ට දඬුවම් දීමේ ක්‍රමයක් නැහැ. අවුරුදු දෙකකින් වතුර ලබා දෙනවාය කියා අවුරුදු පහක් ගතවනතුරුත් වතුර ලබා නොදී ගොවීන් නොයෙක් අමාරුකම්වලට පත් කරන මේ උදවියට විරුද්ධව කිසියම් ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. නිලධාරීන් කරන වැරදි සම්බන්ධයෙන් ගොවියාට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් ගොවියාට කිසිම සහනයක්, නිදහසක්, අයිතිවාසිකමක් ලැබෙන ආකාරයට නොවෙයි, මේ සංශෝධනය සකස් කර තිබෙන්නේ. කලින් තිබුණු නීතිය තවත් දරුණු විධියට සංශෝධනය කර ගොවියා මිරිකීමට ආයුධයක් හැටියට මෙය ගත්තා මිස ගොවියාට ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ගත්තා නොවෙයි. නිලධාරීන්ගේ වැරදි නිසා ගොවියාට විශාල අලාභ හානි වෙනවා. ඒ සම්බන්ධයෙන් සහනයක් මේ ජනපදවල පදිංචි ගොවීන්ට ලැබෙන්නේ නැහැ. දෙපාර්තමේන්තුව මගින්වත්, ඇමති මණ්ඩලය මගින්වත් වෙන කොයි අන්දමකින්වත් ඒ උදවියට සහනයක් නැහැ. ඒ නිසා මේ සංශෝධන පනත ජනපදවල ඉන්න ගොවි ජනයා ඉඩම් නැති ජනයා කිරීමට ආධාර කිරීමේ වැඩ පිළිවෙළකට හේතු වන, නැඹුරු වන නීති මාලාවක් බව පිළිගන්නට අපට සිදු වී තිබෙනවා.

මේ සංශෝධන පනතේ හැටියට අවසර පත්‍ර දරන්නාගේ ඇඳ ඇතිරිලි තහනමට ගන්නට ආණ්ඩුවට බැහැ. අනෙක් එවල දේපල ගත හැකියි. අනෙක් හැම දෙයක්ම තහනම් කරන්නට පුළුවනි. කන්න බොන්න පවා දෙයක් නැතිව හාමතේ ඉන්නට සිදු වෙතත් රෑට නිදා ගන්නට නම් පුළුවනි. ඒ අයිතිවාසිකම සහතික කර තිබෙනවා. මීට පස්සේ ආණ්ඩුව යම් ඉඩමක් තහනම් කරනවා නම් තහනම් කිරීමේ දැන්වීම ඇලෙව්වාම ඇති. ගොවියාට සිතාසියක් භාර දීම සම්බන්ධයෙන් තිබුණු තත්ත්වය වෙනුවට අළුත් තත්ත්වයක් ඇති කර තිබෙනවා. ඊට අදාළ වගන්තියේ තිබෙන්නේ මේ ආකාරයටයි.

"140 වන වගන්තියෙහි සඳහන් ඉඩමක් තහනමට ගැනීම, ඒ ඉඩම සතු කර දෙනු ලැබූ අවසර පත්‍ර දරන්නා වෙත නියමිත ආකෘතියට සාරානුකූල වූ දැන්වීමක් භාර දීමෙන් හා ඒ දැන්වීමෙහි පිටපතක් ඒ ඉඩමෙහි ප්‍රකට ස්ථානයක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඇලවීමෙන් ක්‍රියාත්මක කළ යුතුය. ඒ ඉඩමට සම්බන්ධ හෝ එය තහනමට ගැනීම බල පාන වෙනයම් තැනැත්තකු වෙතද ඒ දැන්වීමේ පිට පතක් භාර දිය හැකිය."

භාර දෙන්නට පුළුවන්කම තිබෙන බව සැබෑවක් වුවත් ඒ ඉඩමේ කොහේ හෝ දැන්වීමක් ඇලෙව්වත් ඇති. කලින් පනතේ තිබුණු දුර්වල ස්ථාන මේ පනතින් ශක්තිමත්කර තිබෙනවා. 142 වන වගන්තිය යටතේ ඉඩම් තහනමට ගැනීම සහ අවසර පත්‍රය අවලංගු කිරීමක් ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රකාශය කළ හැටියේ වගා කරන්නට තිබුණු අවසර පත්‍රය ඉබේම තහනම් වෙනවා.

81 වැනි වගන්තිය පරීක්ෂා කර බැලීම සුදුසුයි. ඒ අනුව පුදුම බලතල ඇමතිවරයාට තිබෙනවා. ඒ කොටසත් මම කියවන්නම් :

"ප්‍රධාන ප්‍රඥප්තියෙහි 165 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි 165අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය.

165අ. (1) මේ පනත යටතේ සතු කරනු ලැබූ යම් ඉඩමක් පිළිබඳ හිමිකම් ඔප්පු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් රජයට විරුද්ධව පවරනු ලැබූ නඩුවක් ඒ තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබූ අවස්ථාවක සහ එම ඉඩම රජය විසින් අත්කර ගැනීම ඇමතිවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, එම ඉඩම මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය ය යි සැලකිය යුතු අතර, ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එය අනිවාර්යයෙන් අත්කර ගත හැකි ය."

යම් ගොවියෙකුට තම ඉඩම පිළිබඳව තමන්ගේ අයිතිය ඔප්පු වී තම වාසියට උසාවියකින් නඩු තීන්දුවක් ලැබුණත්, එවැනි අවස්ථාවලදී ඇමතිවරයාට කියන්නට සුළු මන්තරයක් මෙහි තිබෙනවා. ඇමතිවරයාට තිබෙන්නේ මෙය මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය ඉඩම් කැබැල්ලක්ය කියන එක පමණයි. ඇමතිවරයාට බලහත්කාරයෙන් ඉඩම් ගන්නට එය නීතියට ඇතුළත් කර තිබෙනවා. ඒ අනුව යම් කෙනෙක් උසාවියක නඩුවක් පවරා එයින් දිනුවත් පැරදුණත් ඔහු පරාදමයි. අන්න ඒ අන්දමටයි මේ නීතිය සංශෝධනය කර තිබෙන්නේ. ඇමතිවරයාට හෝ ඇමතිවරයාගේ පක්ෂයට හෝ පක්ෂපාත නැති අයට ඉඩම් තිබෙනවා නම්, එවැනි ඉඩමක් රජයට පවරා ගන්නට යන අවස්ථාවකදී රටේ තිබෙන නීතියට අනුව එම ඉඩම තමාට අයිති බව උසාවියකදී ඔප්පු කරනු ලැබූ අවස්ථාවක එය ඇමතිවරයාට පවරා ගැනීමට හැකි වන පරිදි මහජන කටයුත්තකට එය අත්පත් කර ගන්නාය කියන එක අනිවාර්යයෙන්ම ඇමතිවරයා විසින් ක්‍රියාවේ යොදවනවා. ඒ නිසා ඕනෑම කෙනෙක් ඕනෑම ජනපදයකින් පැන්නීමට ඇමතිවරයා සර්වබලධාරී වෙනවා.

ඇඹිලිපිටිය ප්‍රදේශයේ විහාරයක සිටින එක්තරා ස්වාමින්වහන්සේ නමක් පැන්නීමටත් දැන් කටයුතු කරගෙන යනවා. එය ආණ්ඩුවේ ඉඩමක් නොවෙයි. එය ආණ්ඩුවට අයිති ඉඩමක් බව ඔප්පු කරන්නට බැහැ. එය පාරම්පරිකව අයිති වූ සාංඝික ඉඩමක්. එහෙත් උසාවියෙන් අයිතිය ලබා ගන්නට බැරි වන විට එය මහජන කටයුත්තකට වුවමනා එකක්ය කියා අයිතිකර ගන්නවා. ඉතාමත්ම දරුණු අසාධාරණ අයුතු අන්දමට ක්‍රියාවේ යොදවන්නට පුළුවන් නීතිය මේ පනතේ තිබෙන 81 වැනි වගන්තියයි. යම් කෙනෙක් යම් ඉඩමක තමන්ගේ අයිතිය උසාවියක මාර්ගයෙන් ඔප්පු කළාට පසුව ඒ ඉඩම මහජන කටයුත්තක් සඳහා අවශ්‍යය කියා ප්‍රකාශයට පත් කර එය අත්පත් කර ගන්නට ඇමතිවරයාට බලය දීම ධනපති ක්‍රමය යටතේ තිබෙන ආණ්ඩුවල අධිකරණයට කරන බලවත් නින්දාවක්. අධිකරණය සාධාරණව නීතිය ක්‍රියාවේ යොදන ආයතනයක් හැටියට මේ ආණ්ඩුව හැම තැනකම කෑගහනවා. සමාජවාදී රටවල අධිකරණයට උසස් තැනක් දෙන්නේ නැත, සමාජවාදී රටවල එය දේශපාලන පක්ෂ ආයුධයක් හැටියට පාවිච්චි කරනවාය, ඒ ක්‍රමය හොඳ නැත, කියා ධනපති ආණ්ඩු විශාල කලබලයක් ඇති කරනවා. ඒ රටවල සිටින ජනතාවට සාධාරණ අන්දමට, නිදහස් පුරවැසියන් හැටියට ජීවත්වීමට නොහැකි වීම ගැන විශාල කැක්කුමක් මේ ඇමතිවරුන්ට තිබෙනවා. නමුත් මේ සංශෝධන පනතින් සිදු වී තිබෙන්නෙ කමක්ද? තමන්ට තිබෙන එකම බිම් කැබැල්ල—කඩාරමක් නැත්නම් ගේ පැලක් සාදා ගැනීමට තිබෙන එකම බිම් කැබැල්ල—අධිකරණය මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අහිමි වීමට අවස්ථාව සැලසෙනවා. මුදල් වියදම් කර නීතිඥයින් ඉදිරිපත් කර උසාවියට ගොස් නඩු මාර්ගයෙන් අයිතිය ඔප්පු කර ගත හොත් එම ඉඩම් කැබැල්ලේ අයිතිය ආණ්ඩුවට ලබා ගැනීමට අවස්ථාවක් සැලසෙනවා. ඒ විධියට ඒ ගොවියන්ට එම ඉඩමේ අයිතියක් නැත කියා ඔප්පු කළ හොත් එම ඉඩම් කැබලි ආණ්ඩුව සතු කර ගැනීමට ඇමතිවරයාට සම්පූර්ණ බලය ලැබෙනවා. ඒ අය එම ඉඩම් වලින් පන්නා දැමීමට ඇමතිවරයාට බලය ලැබෙනවා. ඒ නිසා මේ අන්දමට ඇමතිවරයාට මේ තරම් විශාල බලතල ලැබෙන නිසා ඒකාධිකාරී ක්‍රමයක් නැත්නම් පැසිස්ට් ක්‍රමයක් ගෙන යාමට පාවිච්චි කළ හැකි ප්‍රධාන ආයුධයක් හැටියට මෙය නම් කරන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අනුව කල්පනා කරන විට අපට පැහැදිලිව පෙනී යන කරුණු කිහිපයක් තිබෙනවා. අද රටේ විශාල සංවර්ධන ව්‍යාපාරවල් තිබෙනවා. ඉඩම් සංවර්ධන ක්‍රම පිළිබඳව බැරෑරුම් ප්‍රශ්න රාශියකට අද මුහුණ පාන්න සිදු වී තිබෙනවා. ඒ නිසා ඉඩම් සංවර්ධන පනතෙහි තිබෙන දුර්වලකම් නැති කර දැමිය යුතුයි. නමුත් එම ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා කිසිම විධියකින් ආධාර වන කෙටුම්පත් පනතක් නොවෙයි මේ ඉදිරිපත් කර තිබෙන්නෙ.

මේ මෑතක් වන තෙක් පැවති ක්‍රමය අනුව ආණ්ඩුව සතු ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් නැති අය අතරේ බෙදා දුන්නා. අක්කර 2, 3, 5 ආදී වශයෙන් ඒ ඒ ප්‍රදේශවල සිටින ඉඩම් නැති අයට ඉඩම් බෙදා දුන්නා. එසේ ඉඩම් බෙදා දුන්නේ වගා කිරීම සඳහායි. ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් අන්සතු කිරීමේ ප්‍රතිපත්තිය යටතේ මෙතෙක් ඒ විධියට කට යුතු කරගෙන ආවා. විදේශිකයිනට ඉඩම් දීම සම්පූර්ණයෙන්ම තහනම් කළා. ඉඩම් සංවර්න ආඥා පනත යටතේ විශාල ධනවතුන්ට ඉඩම් දීම තහනම් කර තිබුණා. නමුත් මේ ආණ්ඩුවේ වැඩපිළිවෙළ අනුව අක්කර දහස් ගණනින් විදේශීය සහ දේශීය ධනපතියන් අතරේ ඉඩම් බෙදා දෙන බවක් පෙනෙනවා. මෙහිදී නම් ප්‍රකාශ කරනවා එසේ බෙදා දී තිබෙන්නේ තාවකාලික වශයෙන්ය කියා. බදු ක්‍රමයට මෙම ඉඩම් වගා කිරීම සඳහා විශාල කොම්පැනිවලට පවරා දුන් බවයි කියන්නෙ. මේ අලුත් ප්‍රතිපත්තිය අනුව අක්කර දහස් ගණනින් ඉඩම් ධනපතියන් අතරේ බෙදා දී තිබෙනවා. එයින් අපට පැහැදිලි වෙනවා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කට යුතු කිරීම සුදුසු නැත කියන හැඟීමක් ඇති වී තිබෙන බවක්. එය ඒ තරම් සුදුසු ක්‍රමයක් නොවන බව සමහර විට පිළිගන්නවා විය හැකියි. සුදුසු ක්‍රමය නම් ලොකු ධනපතියන් අතරේ අක්කර දහස් ගණනින් වගා කිරීම සඳහා ඉඩම් බෙදා දීමය කියා කල්පනා කරනවා විය හැකියි. ආහාර ප්‍රශ්නය විසඳීම සඳහා, අමතර ආහාර වැඩියෙන් වගා කිරීමට එය සුදුසු ක්‍රමයක්ය කියා කල්පනා කරනවා විය හැකියි. පසු ගිය ශත වර්ෂවලදී—යටත් විජිත ආණ්ඩු කාලයේදී— තේ, රබර් වැවීම සඳහා ධනවතුන් අතරේ ඉඩම් බෙදා දුන්නා වාගේ දැනුත් ක්‍රියා කරනවා විය හැකියි. එම ප්‍රතිපත්තිය නැවතත් මතු කර තිබෙන බවක් අපට පෙනෙනවා. වියළි ප්‍රදේශවලින් අක්කර දහස් ගණනක ඉඩම් ප්‍රමාණයක් අමතර ආහාර ගොවිතැන සඳහා ධනපති ක්‍රමය උඩ ධනවතුන් අතරේ බෙදා දී තිබෙනවා. ඒවා වගා කිරීම සඳහා ආණ්ඩුවේ සම්පූර්ණ ආධාරත් ලබා දෙනවා. ඒ සඳහා විදේශ විනිමය යෙදවීමට පුළුවන් අන්දමට කට යුතු කර තිබෙනවා. මේ ගරු සභාවේදී මේ කරුණ සම්බන්ධයෙන් කීප විටක්ම ප්‍රකාශ කර තිබෙනවා. මේ ක්‍රමය යටතේ කොළඹ 7 පවුල්වල සිටින උදවියට කාර්, ලොරි, ජීප් රථ ආදිය ලබා ගැනීමට අවසථාව සැලසුණා. ආහාර වගාවේ නාමයෙන් විශාල ඉඩම් අන් සතු කිරීමේ වැඩපිළිවෙළක් මේ රජය මගින් ඇන් කරගෙන යනවා. මීට ඉස්සර තිබුණු ඉඩම් සංවර්ධන ප්‍රතිපත්තියේ හැටියට නම්, ඒ විධියට ඉඩම් දීම එම ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන්ම විරුද්ධ බව ඉතා පැහැදිලි වශයෙන් සඳහන් වී තිබුණා. එහෙත් අද සිදු වන්නේ, වගා නොකරන ලද ඉඩම් අක්කර දහස් ගණනින් ලොකු ධනපතියන්ට දීම පමණක් නොවෙයි. ජනපදවල ඉඩම් නැති ගොවීන්ට දී තිබෙන ඉඩකඩම් ටික පවා අන්සතු කිරීමේ වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ඇන් යොදා තිබෙනවා. කළ යුතුව තිබුණු නියම දේ නම්, මේ කරුණු පිළිබඳව නියම විධියේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

පරීක්ෂණයක් පවත්වා ඉඩම් සම්බන්ධයෙන් අද පවතින කනගාටුදායක තත්ත්වය ගැන විස්තර පළමුවෙන් සොයා ගැනීමයි.

අද බොහෝ ජනපදවල නමට පමණක් ගොවීන් සිටියත්, සෑම ඉඩමක්ම අනිවාර්යයෙන්ම තමන් විසින් වගා කළ යුතුයයි නීතියක් නමින් පමණක් තිබුණත්, බොහෝ ප්‍රදේශවල ජනපදවල ක්‍රියාත්මක වන්නේ අද ක්‍රමයටත් වඩා දරුණු ක්‍රමයක් බව මා විශේෂයෙන් පෙන්වා දෙන්න කැමතියි. බලපත්‍ර හිමි ගොවීන් ජනපදවල සිටින්නේ නමින් පමණයි. ලොකු මුදලාලිලා අක්කර 20,30,40,50 ආදී වශයෙන් ඉඩම් අල්ලාගෙන වගා කරනවා. එසේ වගා කොට ලැබෙන අස්වැන්න එම මුදලාලිලා විසින් ගොවීන්ගේ නමින් සහතික මිළ ක්‍රමය අනුව විකුණනවා. දැන් සහතික මිළට වඩා විකිණිය හැකි නිසා සහතික මිළ ගැන වැඩි සැලකිල්ලක් දැක්වෙන්නෙත් නැහැ. මේ විධියට ධනපති ක්‍රමය යටතේ ගොවිතැන් කිරීම නිසා ගොවීන්ගේ නමින් විශාල ආදායම් ලබා ගන්නේ විශාල ලෙස ධනය රැස් කරන ධනපති මුදලාලිලා ටික දෙනකු පමණයි. ආණ්ඩුවෙන් අඩු මිළට දෙන පෝර ටිකත් ඔවුන් ගොවීන්ගේ නමින් ලබා ගන්නවා. වැඩ කරන ගොවීන්ට සෑහෙන කුලියක් මේ ධනපති මුදලාලිලා ගෙවන්නේ නැහැ. ජනපදවල ගොවීන්ට අද සිදු වී තිබෙන්නේ, අද ගොවිතැන් ක්‍රමය අනුව සුළු ආදායමක් ලබාගෙන දුකසේ ජීවත් වන්නටයි.

ගොවීන්ට ණයට මුදල් දෙන කුට වෙළෙන්දාත් ධනපති මුදලාලිලාත් ඉවත් කර, තම ශ්‍රමය යොදා වැඩ කරන ගොවියාට ඔහුගේ ගොවිතැන්වල ප්‍රයෝජනය සම්පූර්ණයෙන්ම ලබා ගත හැකි අන්දමට ජනපද ක්‍රමය සංශෝධනය කළ යුත්තේ කෙසේද යන්න ගැන පරීක්ෂණයක් පවත්වා, සමුපකාර ක්‍රමයක් අනුව හෝ වෙනත් ක්‍රමයක් අනුව හෝ වගා කිරීමෙන් ගොවීන්ට සහනයක් ලැබෙන අන්දමේ වැඩ පිළිවෙළක් යෙදීමට නීති සම්පාදනය කිරීම ඉතාම අවශ්‍යයි. මේ සම්බන්ධව විශේෂ විස්තරයක් කරන්මට මා කැමතියි. මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරයේ ඇති වැදගත්කමත් වටිනාකමත් අද ගරු ඇමතිතුමා [illegible] කියාගෙන යනවා. එහෙත්, එතුමා ඒ ව්‍යාපාරය විස්තර කිරීමේදී එක් කරුණක් පමණක් කියන්නේ නැහැ. මහවැලි ගඟ හැරවීමට ඇමෙරිකන්කාරයන් විසින් යොදන ලද වැඩ පිළිවෙළේ තිබුණු දුර්වලකම් මෙම ගරු සභාවේදී පෙන්වා ඔප්පු කිරීමෙන් පසු, පළමුවෙන් කරන්නට ගිය වැඩ පිළිවෙළ නතර කොට, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසින් නියම විධියේ පරීක්ෂණයක් පවත්වා අලුත් සැලැස්මක් අනුව, අක්කර 10 ලක්ෂයක් පමණ වගා කළ හැකි වන අන්දමටත් නියම ජාතික දියුණුවක් ඇතිවන අන්දමටත් ඇමෙරිකන්කාරයන් යෙදූ පිළිවෙළට වඩා ඉතා උසස් අන්දමටත් ඉතා ඵලදායක අන්දමටත් වැඩ පිළිවෙළක් යෙදූ බව ගරු ඇමතිතුමා වැඩිපුර මතක් කරන්නේ නැහැ. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට මෙම ව්‍යාපාරය ගැන කටයුතු කරන්න නියම කළ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් 1964 දී පළමුවෙන්ම ඉදිරිපත් කළ වාර්තාවේ මෙසේ ප්‍රකාශ කර තිබෙනවා. එහි 46 වැනි වගන්තිය මෙසේයි:

"In the first period of agronomical studies the determination of water requirements of various crops grown locally, formulation of practical cropping patterns including crop diversification and rotation, and improvement of farming practices, will be carried out in collaboration with the irrigation engineers in Polonnaruwa and Minipe.

The rural sociological studies by the present rural institutional system will be assisted including land ownership and tenancy, co-operative credit, etc. and advice on the changes deemed advisable for the purposes of agricultural development, given."

මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපාරය සම්බන්ධයෙන් එක්සත් ජතීන්ගේ මණ්ඩලයේ විශේෂඥයින් විසින්, ජලාසය ඇති කිරීම, ජල විදුලි බලය ඇතිකිරීම, වාරිමාර්ග ක්‍රම සඳහා ජලය හැරවීම, ආදී ප්‍රශ්න ගැන කරුණු ඉදිරිපත් කරන ගමන්ම, ඉඩම් සංවර්ධනය කිරීම පිණිස ජලය ලැබුණු විට එම ඉඩම් වගා කරන්නේ කෙසේද, ඒවායේ අයිතිය මොන අන්දමට යොදන්න ඕනෑද, එක් ගොවියකුට මොන තරම් ප්‍රමාණයක් අයත් වෙන්න ඕනෑද, මොන අන්දමේ සමුපකාර ක්‍රමයක් අනුව ගොවිතැනින් වැඩිපුර අස්වැන්න ප්‍රමාණයක් ලබාගත හැකිද, යන සමාජමය ප්‍රශ්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙනුත් අපේ රටේ නිලධාරීන් සමග කරුණු පරීක්ෂා කර බලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය මගින් එවනු ලැබූ විශේෂඥයන් විසින් මා සඳහන් කළ ඒ කාරණා ගැනත් කරුණු පරීක්‍ෂා කර ඇති බව 1964 සැප්තැම්බර් මාසයේදී නිකුත් කළ කෙටුම්පත් වාර්තාවේ සඳහන් කර තිබෙනවා. 1967 අවසාන භාගයේදී ඉදිරිපත් කළ වාර්තාවේ තව දුරටත් ඒ සම්බන්ධයෙන් මෙසේ සඳහන් කර තිබෙනවා:

"No recommendations have as yet been made concerning the type of settlement to be finally adopted (small proprietary farmings, large farms, or plantations). Studies, already begun, to make this essential decision should be actively pursued during stage II of the U.N.D.P. study to determine the optimum types of settlement and of farming organizations to be recommended, taking due account of (i) the abundance of farm labour; (ii) the scarcity of foreign exchange needed to purchase machinery; and (iii) the possibility of making available to small farms *through co-operatives*, some, at least, of the advantages of large-scale capital intensive farming (mechanization, managerial ability, technical guidance, etc.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන විට, මහවැලි ගඟ ව්‍යාපාරයෙන් අක්කර දස ලක්ෂයක ප්‍රමාණයක් වගා කරන්න පුළුවන් කාලය වන විට, මෙම ඉඩම් මොන අන්දමට වගා කරන්න ඕනෑද කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් මෙම වාර්තාවෙන් කර තිබෙනවා. ජනපද යෝජනා ක්‍රමවල අද තිබෙන දුර්වලකම් මග හැර ගන්නේ කොහොමද, විශාල ගොවිපළවලට තිබෙන වාසිය සුළු ගොවිපළවලට නැති නිසා, සුළුගොවිපළවල් විශාල ධනවතුන්ට ගිල ගන්න ඉඩ දෙන්නේ නැතුව, සුළු ගොවිපළවල ඒ අයිතිය ඒ ආකාරයෙන්ම දිගටම තබා ගන්න අතර විශාල ගොවිපළවලට තිබෙන වාසිදායක තත්ත්වය සුළු ගොවිපළවලට ලබා ගන්නේ කොහොමද, එසේ ලබාගෙන කටයුතු කරන්නේ කොහොමද, ඒ කටයුතුවලට සමුපකාර ප්‍රතිපත්තිය කොයි තරම් දුරට ආධාර වෙනවාද, එසේ නැතිනම් විශාල ගොවිපලවල් වතු ක්‍රමයට යොදනවාද, වැනි ප්‍රශ්න ගැන පැහැදිලි වශයෙන් කරුණු පරීක්ෂා කර බැලීම ඉතාමත් අවශ්‍ය බව සඳහන් කර තිබෙනවා. ඉඩම්වලට යන්නට ප්‍රථමයෙන් ඒ ගැන කටයුතු කිරීම සඳහා නියම ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඉතාමත්ම අවශ්‍ය බව ප්‍රකාශ කර තිබෙනවා. එහෙත් ඉඩම් සංවර්ධන සංශෝධන පනත දෙස බලන විට, මෙහෙම වාර්තාවක් තිබෙන බවවත් ඇමතිතුමා දන්නවද කියා සැකයක් ඇති වෙනවා. ඇමතිතුමා ඒ ගැන දන්නවා නම් මෙවැනි ප්‍රශ්න සම්බන්ධ වැඩ පිළිවෙළක් තමයි, මේ සංශෝධන පනතෙන් ඇති කළ යුත්තේ. මේ සංශෝධනය නැතිවාට කිසිම කෙනකුට අමාරුවක් නැහැ. සමහරවිට ඇපයට තැබීම සඳහා ඔප්පුව පාවිච්චි කරන්නට බැරි වෙයි. ඉඩම හෝ හාල් පොත හෝ උගස් නොතියා ගොවියකුට බැංකුවෙන් ණය ගන්නට තිබෙන මූලික අයිතිවාසිකම උදුරා ගැනීම සම්පූර්ණයෙන්ම වැරදියි. මේ පනත සම්මත වුණායින් පසු බැංකුවට අයිතියක් තියෙනවා, ණය දීම සඳහා ඉඩම උගසට ගන්නට; ණය නොගෙව්වොත් ඉඩම විකුණන්නට. ඒ නිසා ගොවියාට දැනට තිබෙන ආරක්‍ෂාවත් නැති වීමයි, මේ සංශෝධන පනතෙන් සිදු වන්නේ. මෙය ජනපදවල ගොවියාට බලපාන දෙයක් නොවෙයි. ධනපති ක්‍රමයේ තිබෙන අසතුටුදායක මූලික බල වේගයන් ක්‍රියාවේ යෙදීමට, දැනට නීතියෙන් තිබෙන තහනම ඉවත් කිරීමයි, මේ සංශෝධන පනතෙන් සිදු වන්නේ. සුළු ගොවීන්ගේ ඉඩම් ටික එක් කෙනකුට අයිති කර ගැනීමට කඩුළු ඇරීමේ තත්ත්වයක් මේ සංශෝධන පනත නිසා ඇති වෙනවා. ඒ නිසා මේ ගැන තව ටිකක් කල්පනා කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අනාගතයේදී වී වගාව සම්බන්ධව හෝ වේවා, අතිරේක ආහාර වගාව සම්බන්ධව හෝ වේවා, මහවැලි ගඟ ව්‍යාපාරය යටතේ වගා කිරීම සම්බන්ධයෙන් හෝ වේවා වැඩ පිළිවෙළක් යෙදීමට අවශ්‍ය වූ විට, ගොවියාට දෙන අක්කර පහේ අයිතිය ඒ ගොවියාට තහවුරු වන අතරම සමුපකාර ක්‍රමයට විශාල ගොවි පොළවල් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් යෙදීමයි, කළ යුත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මහියංගනය වැනි ප්‍රදේශවල අක්කර 100, 200, 500, 1,000 විදේශික කොම්පැනි කාරයන්ට දී තිබෙනවා. ඒ ක්‍රමය නැති කර, ඉඩම් නැති අය පමණක් නොව වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

කරන්නට පුළුවන් දක්ෂ ගොවීනුත් සම්බන්ධ කරගෙන, ඒ උදවියත් ඒ ඉඩම්වල පදිංචි කරවා, ඒ අයගේ ඉඩම් කොටසේ අයිතියත් තහවුරු කර, පාලනය සඳහා සුදුසු නිලධාරීනුත් යොදවා විශාල වශයෙන් සමූපකාර ක්‍රමයට ගොවිතැන් කර වීම සඳහා ඉඩම් සංවර්ධන සංශෝධන පනතක් ඉදිරිපත් කිරීම රටේත්, ගොවියාගේත් දියුණුව සඳහා ඉතා අවශ්‍යයි.

මේ ක්‍රමයෙන් එක් කාරණයක් හොඳින් පැහැදිලි වෙනවා. ධනපති ක්‍රමය අනුව සුළු ගොවීන් විශාල ධනවතුන්ගේ ණය කරුවන් වන තත්ත්වයක් ගරු ඇමති තුමා ඇති කර තිබෙනවා. මේ ඇමතිවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ සිටින කාලයේත් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කළ බව අප දන්නවා. සමූපකාර ක්‍රමයට ලොකු විරුද්ධත්වයක් එතුමා ඒ කාලයේත් දැක්වුවා. සමහරවිට සුළු ඉඩම් ඒ ක්‍රමයට වගා කළා. එහෙත් ලොකු ඉඩම් වගා කිරීම නම් ධනපති ක්‍රමයට පමණක් සීමා විය යුතු බවට එතුමා ඇරූ අදහස මේ ආණ්ඩුවේම ප්‍රතිපත්තිය හැටියට ආණ්ඩුවේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරගෙන යනවා.

මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම සඳහා මෑතදී එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ නියෝජිතයෙක්—අමෙරිකන් නියෝජිතයෙක්—ලංකාවට ආවා. රජයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් කීප දෙනකු සමඟම මේ නියෝජිතයා සාකච්ඡා කළාලු. ඒ සාකච්ඡාවලදී කියා තිබෙන්නේ මොනවාද? මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය සඳහා විශාල විදේශ විනිමයක් වැය කිරීම අවශ්‍යලු. එම නිසා, විදේශ විනිමය වශයෙන් ලැබෙන ණයක් ගැනීමත් අවශ්‍යලු. ඒ ණය ලෝක බැංකුවෙන් ලබා ගන්නවා නම්, ඒ සඳහා ලෝක බැංකුවේ කොන්දේසි ආදිය පිළිබඳව ඈන්ම ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් යෙදීමත් අවශ්‍යලු. ඒ සාකච්ඡාවලදී මා කලින් සඳහන් කළ අදහස් පළ කර තිබෙන බව ආරංචියි.

එහෙත් ලෝක බැංකුව ණය දෙන්නේ කාටද? අද තිබෙන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඇති කොට තිබෙන ජනපදවල වෙසෙන ගොවීන්ට ණය දෙන්නට ලෝක බැංකුව අකමැතිලු. ඉඩම් අක්කර දෙක තුන, නැත්නම් හතර පහ ඇති ගොවීන්ට ලැබෙන ආදායම මදිලු, ලෝක බැංකුවෙන් ලැබෙන ණය පොළියත් සමඟ ආපසු ගෙවන්න. ඒ වාගේම, මේ ආණ්ඩුවේ වියදම ආදායමට වඩා වැඩි නිසාත්, ආණ්ඩුව ආර්ථික වශයෙන් අමාරු තත්ත්වයක වැටී සිටින නිසාත්, ආණ්ඩුව ඇප වුණත් ණය දෙන්න බැරිලු. එහෙම නම්, ණය දීම සඳහා ලෝක බැංකුව ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ මොකක්ද? සංවර්ධනය කරන්නට බලාපොරොත්තු වන අක්කර දස ලක්ෂයෙන් විශාල කොටසක් විදේශීය කොම්පැණිකාරයන්ට හිමි වන විධියට කටයුතු කරන්නට ආණ්ඩුව සහතික වෙනවා නම්, ඒ කොන්දේසිය උඩ සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල මුදලක් ණය දෙන්නට අමෙරිකන් ලෝක බැංකුව ලෑස්තිලු.

එවිට ඇති වන තත්ත්වය මොකක්ද? යටත්විජිත යුගයේදී බිහි වුණු, උඩරට කඳුකරයේ තේ වතු යායවල් වැනි, ධනපති ක්‍රමයේ වතු යායවල් වියළි ප්‍රදේශයේත් බිහි වීමයි. ධනපති ක්‍රමයට සංවර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය ධනේශ්වරයන්ට අවකාශය සැලසෙන වැඩ පිළිවෙළක් යෙදවිය යුතු යයි අර නියෝජිතයා දක්වූ අදහස පිළිබඳව රජය දරන පැහැදිළි මතය කුමක්දැයි මා දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ වාර්තාවක් තිබුණා. මම එහි අදහස සංක්ෂේපයෙන් කියන්නම්. අද ලෝකයේ විශාල ආහාර නිෂ්පාදනය තිබෙන්නේ සෝවියට් රුසියාවේයි. විශාලම ඉඩම් ප්‍රමාණයක තිරිඟු වගා කරන්නේත් සෝවියට් රුසියාවේයි. ඊළඟට වැඩි ප්‍රමාණයක් වගා කරන්නේ ඇමෙරිකාවේයි. එහෙත් සෝවියට් රුසියාව ඇමෙරිකා එක්සත් ජනපදයට වඩා විශාලයි. සෝවියට් රුසියාවේ අක්කරයක නිෂ්පාදන ප්‍රමාණය ඇමෙරිකාවේ අක්කරයක නිෂ්පාදන ප්‍රමාණයට වඩා අඩුයි. එහෙත් වැඩි ඉඩම් ප්‍රමාණයක් වගා කරන නිසා අඩුව මැකී යනවා. මේ රටවල් දෙකේම ජනගහණය එක හා සමානයි. සෝවියට් රුසියාව නිෂ්පාදනය කරන තිරිඟු ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ඒ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රයෝජනය සඳහා යොදා ගන්නවා. හදිසියේ යම් රටකට ආධාරයක් වශයෙන් තිරිඟු ටිකක් යැව්වත් ඒ වෙනුවට කැනඩාවෙන් තිරිඟු මිළයට ගන්නවා. මා මුලින් කිව්වාක් මෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේත්, සෝවියට් රුසියාවේත් ජනගහණය එක හා සමානයි. රුසියාව ඇමෙරිකාවට වඩා ස්වල්පයක් අඩුවෙන් නිෂ්පාදනය කරනත් පිටරටින්ද තිරිඟු මිළයට ගන්නවා. හැබැයි, ඇමෙරිකාව නිෂ්පාදනය කරන මුළු තිරිඟු ප්‍රමාණයෙන් දෙකෙන් කොටසක් පීඑල් 480 යටතේ ලංකාව ඉන්දියාව වැනි රටවලට එවනවා. සමාජවාදී රටේ සිටින ජනගහණයේ ප්‍රයෝජනය සඳහා එහි නිෂ්පාදනය කරන මුළු තිරිඟු ප්‍රමාණයම යොදවතත්, සමහරවිට පිටරටින්ද තිරිඟු මිළයට ගනිතත්, ඇමෙරිකාව තමන් නිෂ්පාදනය කරන ප්‍රමාණයෙන් අඩක් පිටරට යවනවා. දැන් ඉතින් ප්‍රශ්නය බොහොම පැහැදිලියි. ඇමෙරිකාවේ තිබෙන්නේ ධනපති ක්‍රමයක්. එහි ආහාර වගාවේ යෙදී සිටින්නෝ කොම්පැනිකාරයෝයි.

මෙම ඉඩම් සංශෝධන පනත මඟින් සුළු ඉඩම්කාරයන්ගේ ඉඩම් ටික බැංකුවලට, එසේ නැත්නම් වෙනත් ආයතනවලට අයිති කර දී තව දුරටත් ඒ ඇමෙරිකාවේ පවතින ක්‍රමය ක්‍රියාත්මක කරන්නටයි, මේ උත්සාහ කරන්නේ. ඇමෙරිකාවේ ආහාර වගාවේ යෙදී සිටින කොම්පැනිකාරයන් සුළු ඉඩම්කාරයන් සම්පූර්ණයෙන්ම ගිළගෙන සිටිනවා. සෝවියට් දේශයේ නම් ගොවිතැන කරගෙන යන්නේ සමූපකාර ක්‍රමයටයි; සමූහ ගොවිපලවල් ක්‍රමයටයි. ගොවියා කුඹුරේ වැඩ කරන තුරු ඔහු වැඩ කරන කුඹුර අන් සතු වන්නේ නැහැ. සමූහ ගොවිපලවල් ක්‍රමයට සෝවියට් රුසියාවේ ගොවිතැන දියුණු කර තිබෙනවා.

ඇමෙරිකාවේ කොම්පැනිකාරයන් තම ගොවිපලවල අස්වැන්න නෙළා ගත් හැටියේම ඇමෙරිකානු ආණ්ඩුව ඒ අස්වැන්න මිළයට ගන්නවා. මිළ පහළ වැටෙන්නට ඉඩ දෙන්නේ නැහැ. මේ නිසා සාමාන්‍ය ගොවියන්ට ආහාර ලබා ගැනීමට අමාරු තත්ත්වයක් පවතිනවා. ඇමෙරිකාවේ ජනගහණයෙන් කෝටි තුනක් මන්දපෝෂණයෙන් පෙළෙනවා. කෝටි තුනකට ප්‍රමාණවත් ආහාර නොලැබෙතත් එහි නිෂ්පාදනය කරන අස්වැන්නෙන් දෙකෙන් කොටසක් පිටරට යවනවා. ජනතාව හාමත්ව සිටියදී නිෂ්පාදනයෙන් අඩක් පිටරට යවනවා. එහි පවතින විශාල කොම්පැනිවලට ගොවිපලවල් අයිතිව ඇති නිසා ආහාර නිෂ්පාදනයෙන් අඩක් පිටරට යවා දේශපාලන හා ආර්ථික ප්‍රයෝජන ලබා ගන්නට ඇමෙරිකාවේ ධනපති ආණ්ඩුව ක්‍රියා කරනවා. ලංකාවේත් ලොකු කොම්පැනිකාරයන් විදේශ කොම්පැනිකාරයන් සමග එකතු වී ඒ විධියට ගොවිතැන් කිරීමට දැන් කටයුතු පිළියෙල කරගෙන යනවා. ජනපදවල සිටි ගොවීන්ට මෙතෙක් කල් ඔවුන් සතුව පැවති ඉඩම් අන් සතු කරන්නට පුළුවන් වුණේ නැහැ. ඇප වශයෙන් හෝ අන් අයට පවරන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ආණ්ඩුවට මුදල් ගෙවන්නට තිබෙනවා යයි කියා හෝ ඒ ඉඩම් අන් සතු කරන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ගොවියාට සහතිකයි ඉඩම. ඒ ගොවියාගෙන් පසු පරම්පරාවේ තවත් ගොවියකුට ඒක අයිති වෙනවා. ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම ධනපති ක්‍රමයට ප්‍රතිවිරුද්ධ ක්‍රමයක්. ධනපති ක්‍රමය අනුව ලොකු ධනවතුන්ට දුප්පත් ගොවීන්ගේ ඉඩම් ගිලගන්නට අවස්ථාවක් නැති නිසා දැන් මේ පනත් කෙටුම්පතින් ඉඩම්වල අයිතිය ගොවියාට සහතික කරනවාය යන ව්‍යාජ ප්‍රකාශය උඩ රට රවටමින් ගොවීන්ගේ ඉඩම් අන් සතු වන තැනට කටයුතු යොදා තිබෙනවා. මේ නීතිය යටතේ සමූපකාර ක්‍රමයට සුළු ගොවීන්ට එකතු වී වැඩ කරන්නට අවස්ථාවක් සැලසෙන්නේ නැහැ.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ වී ගොවිතැන පිළිබඳව පමණක් නොවෙයි, වෙනත් වගාවන් පිළිබඳවත් ජනපද ක්‍රම ඇති කර තිබෙනවා. 1956 න් පසු, පළමු වරට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව යටතේ තේ වැවීම සඳහා උස් බිම් ජනපද ව්‍යාපාර කීපයක් ආරම්භ කර තිබෙනවා. දෙනියායේ ඇරංගල, කලුබෝවිටියන යන ප්‍රදේශවල එවැනි උස් බිම් ජනපද ක්‍රම යටතේ අක්කර දහස් ගණනක් තේ වගා කිරීම සඳහා දී තිබෙනවා. තේ වැවීම සඳහා අක්කර දෙක බැගින් ගොවියකුට දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

තිබෙනවා. ඒ හැර ගෙයක් සාදා ගැනීමවත්, තවත් ඔය ආහාරයට වුවමනා වගාවන් කර ගැනීමටත් අක්කර කාල බැගින් දී තිබෙනවා. මේ ජනපද ක්‍රමය යටතේ තේ වවන ගොවියකුට දෙන්නේ රු. 2,000 ක මුදලක් පමණයි. නමුත් පරණ තේ උගුල්ලා අළුතෙන් රිකිලි තේ වවන ලොකු ධනපතියන්ට ඒ සඳහා අක්කරයකට රු. 4,250 ක් දෙනවා. ජනපදවල ගොවීන්ට අක්කර දෙකක වගා කරන්නට රිකිලි තේ දෙන්නේ නැහැ. ඒ අයට රිකිලි තේ තහනම්. ඒ අය තේ ඇට තවාන් කර සිටුවන්නට ඕනෑ. නමුත් රිකිලි තේ වලින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය ඇට සිටුවා වගා කරන තේ වලින් ලැබෙන අස්වැන්නට වඩා හතර ගුණයකින් වැඩියි. නවීන ක්‍රමයට, තේ දළු වැඩියෙන් ලබා ගත හැකි ක්‍රමයට වැඩ කරන්නට ජනපදවල ගොවීන්ට අවස්ථාව සලසා දෙන්නේ නැහැ. රු. 2,000 දෙන්නෙත් කොටස් වශයෙනුයි.

එපමණක් නොවෙයි. තේ වගා කිරීමට පිළියෙළ කර තිබෙන මෙවැනි යෝජනා ක්‍රම යටතේ නිතරම ඒ ගොවීන්ට ආණ්ඩුවෙන් හිරිහැර කරනවා; අසාධාරණකම් කරනවා. උස් බිම් ගොවි ජනපදවලට යන පාරවල් කැපීම ආණ්ඩුව භාර ගෙන තිබෙනවා. නමුත් බොහෝ ස්ථානවල අවුරුදු තුනක් හතරක් තිස්සේ කිසිම පාරක් කැපී නැහැ. එම නිසා දුප්පත් ගොවීන්ට වුවමනා පොහොර ටිකවත් ඇද ගන්නට ක්‍රමයක් නැහැ. ගමන් බිමන් පහසුව නැහැ. ආණ්ඩුවෙන් දෙන පොරොන්දු ඉෂ්ට කිරීම භාර වන්නේ දිසාපතිවරයාටයි. නමුත් දිසාපතිවරුනුත්, ඉඩම් කොමසාරිස්වරයාත් ඇමතිවරයාත් යටතේ තිබෙන පාලනයේ දුර්වලකම් නිසා මේ ජනපදවල පදිංචි කරවා සිටින ගොවීන්ට සහනයක් ලැබෙන්නේ නැහැ. මේ ගොවීන්ට දී තිබෙන පොරොන්දු ඉෂ්ට වන්නේ නැහැ. නමුත් නිලධාරීන්ට විරුද්ධව කිසිම දඬුවමක් නැහැ. නිලධාරීන්ට විරුද්ධව කිසිම නඩුවක් නැහැ.

දැන් මේ අළුත් පනත යටතේ ගොවියා බදු ගෙවන්නට ඕනෑ. අක්කර දෙකක තේ වගා කළාට පසු අවුරුදු හතරක් ගත වුණාම රු. 70 බැගින් ගෙවන්නට ඕනෑ. ආණ්ඩුවෙන් දුන් මුදල සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන්නට ඕනෑ. දෙනියායේ ඒ උස් බිම් ජනපදවලට නොම්මර දහයක් පමණ ඈතින් ධනවත් වතුකාරයකුත් තේ වවනවා. ඔහුට ලබන වර්ෂයේ සිට අක්කරයකට රු. 4,250ක් ලැබෙනවා. දැනට රු. 3,750ක් ලැබෙනවා. ඒ දෙන මුදලෙන් නම් ශතයක්වත් ආපසු ගෙවන්නේ නැහැ. නමුත් මේ දුප්පත් ගොවීන්ට දෙන රු. 2,000—ඉඩම් නැතිකම නිසා, දුප්පත්කම නිසා, ඉඩම් කෑල්ලක් ලබා ගෙන මේ ජනපදවලට ගොස් පදිංචි වූ දුප්පත් ගොවීන්ට දෙන රු. 2,000—නම් ආපසු ගෙවන්නට ඕනෑ.

එපමණක් නොවෙයි. මේ ගොවීන්ට දෙනවා තේ ඇට. නීතියට අනුව නම් හොඳ තේ ඇට මේ අයට දෙන්නට ඕනෑ. ඒවා බෙදා දෙන්නෙත් හොඳ තේ ඇට බව කියමිනුයි. එහෙත් පැල වුණායින් පසු ඒවා ඉතා නරක තේ ඇට බවයි පෙනී යන්නේ. අපි කෙහොමද තේ ඇට තෝරන්නේ යනුවෙන් නිලධාරීන් මේ සම්බන්ධයෙන් කියන්නට පුළුවනි. ඉන්දුවායින් පසු ඒවා නරක තේ ඇට බව පෙනී ගියහොත් එම ගොවීන්ට ඒ වෙනුවට අළුතින් තේ පැල ලබා ගන්නට හැකි වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කර දෙන්නට වුවමනායි. එහෙත් එවැනි වැඩ පිළිවෙළක් යොදා ඇත්තේ නැහැ. ජනපදවල විශාල වශයෙන් තිබෙන්නේ ඉතා බාල තේ වර්ගයි. ඒවායේ අස්වැන්න අඩුයි. බෙහොම මහන්සි අරගෙන කටයුතු කළත් ජනපදවලින් ලැබෙන ආදායම අඩුයි. මාසයකට අක්කරයකින් අමු දළු රාත්තල් 500ක් පමණ කඩන්නට ජනපදවාසීන්ට පුළුවන්කම ලැබෙනවා. ඒ සඳහා හුඟක් මහන්සි ගන්නට ඕනෑ. එහෙත් මා කී අන්දමට ආධාර ලබාගෙන රිකිලි තේ වවන ලොකු ධනවතාගේ ඉඩමේ අක්කරයකින් මසකට අමු දළු රාත්තල් 1,500ක් පමණ කඩන්නට පුළුවනි. මේ දෙකොටස අතර ඇති පරතරය දැන් පැහැදිළිව පෙනෙනවා ඇති. හොඳට මහන්සි වී වැඩ කරන ජනපද ගොවියාට අක්කරයකින් මසකට ලැබෙන්නේ රාත්තල් 500 නමුත් රිකිලි තේ වවන ධනවතාට අක්කරයකින් අමු දළු රාත්තල් 1,500ක් ලැබෙන තත්ත්වයක් උදා වී ඇති හෙයින් ඔවුන් සමඟ තරඟ කරන්නට සාමාන්‍ය ගොවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යාට පුළුවන්කමක් තිබෙනවාදැයි මා ප්‍රශ්න කරනවා. සාමාන්‍ය ගොවියාට දෙන්නට පොරොන්දු වී තිබෙන ආධාරය නියම වේලාවට නොදෙන විට ඔහු කෙසේ කට යුතු කරන්නද ? හැරත් එම ආධාරය ලබා ගැනීම සඳහා නඩු කියන්නටවත් ඔහුට අයිතිවාසිකමක් ඇත්තේ නැහැ.

රජයේ නියමය හැටියට අක්කර දෙකක පැල සිටුවීම සඳහා රුපියල් 900ක් දෙන්නට ඕනෑ. ඒ මුදල් දෙන්නේත් වැඩ කරන කරන හැටියටයි. බොහෝ දෙනාට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා නැහැ. නීතියෙන් ඒ උදවියට මෙය ලබා ගන්නට අයිතියක් ඇත්තේත් නැහැ. දළු කඩන තුරු වල් නෙලීම සඳහා රුපියල් 600ක් ගෙවන්නට නියමයි. එම මුදලත් බොහෝ ජනපද වල ගොවීන්ට ලැබෙන්නේ නැහැ. එහෙත් නීතියෙන් එය ලබා ගන්නට ඔහුට අයිතියක් ඇත්තේත් නැහැ. කාණු හදන්නට රුපියල් 200ක් දෙන්නට නියමිත නමුත් ඒක සම්පූර්ණයෙන් ලැබෙන්නේත් නැහැ. පැළ මිය ගිය පසු පාලු වන තැන් වලට අළුත් ඒවා ඉන්දීම සඳහා රුපියල් 600ක් දෙන්නට නියම කර තිබෙන නමුත් ඒ මුදලත් ලැබෙන්නේ නැහැමයි. සාමාන්‍ය ගොවියාට කොතරම් කරදර හිරිහැරවලට මුහුණ දෙන්නට සිදු වෙනවාද යන්න අපට මේ අනුව පෙනී යනවා. දිසාපතිට විරුද්ධව නඩු පවරන්නට ඔහුට අයිතියක් ඇත්තේත් නැහැ. ගොවීන් පන්නා දමා ආණ්ඩුවට එම ඉඩම් අත් කර ගැනීම වැනි කටයුතුවලට අවශ්‍ය නීති රීති නිතර ක්‍රියාවෙ යොදවනවා. මෙම නීතියට අනුව රුපියල් 100 දඩය රුපියල් 500 දක්වා වැඩි කර තිබෙනවා. නෝටිස් එකකින් පසු ඉඩම ආණ්ඩුවට අයිති කර ගන්නට හැකි වන අන්දමට නීති සංශෝධනය කරනවා. එහෙත් මේ එකම නීතියක්වත් කියා නැහැ, නිලධාරීන් වැරදි කළ විට කටයුතු කරන අන්දම ගැන. මහජන මුදලින් පඩි කන නිලධාරීන් ගොවියාට රජයෙන් නියම කරන ආධාරය නිසියාකාර නොදෙන විට එම අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරන්නට ගොවියාට කිසිම අයිතියක් නැහැ. එසේ හෙයින් මෙය නීති සංශෝධනය කිරීමකැයි ප්‍රකාශ කිරීම භාෂාවට කරන නින්දාවක් හැටියට සලකන්නට පුළුවනි.

එක ජනපදයක ගෙවල් 50ක් හදන්නට සැලැස්ම යෙදුවා. තාවකාලික මඩු වලයි පවුල් පදිංචිව සිටින්නේ. ගෙවල් 50ක් හදන්නට ගියාට මොකද ගෙවල් විසි ගණනයි හැදුවේ. පාරවල් හැදුවෙත් නැහැ. තේ වගාව නියම අන්දමින් කර ගන්නට බැරි තත්ත්වයකට මුහුණ පා සිටින ඒ ගොවීන්ට විශාල අමාරුකම්වලට මුහුණ දෙන්න සිද්ධ වී තිබෙනවා. තේ නිසරු වී තිබෙනවා. තේ වගා කටයුතු ආණ්ඩුවේ සැලැස්ම අනුව ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඔය අන්දමේ කණගාටුදායක තත්ත්වයකටයි අද ජනපද වැටී තිබෙන්නෙ. ඒ කරදර මධ්‍යයේ ආණ්ඩුවෙන් තේ කර්මාන්තශාලාවක් හැදුවා. එහි පාලනය අංශ දෙකකට වැටී තිබෙනවා. ජනපදවල ඉඩම් සංවර්ධනය පිළිබඳ පාලනය තිබෙන්නේ දිසාපතිතුමාටයි. තේ කර්මාන්තශාලාව පාලනය කෙරෙන්නේ රාජ්‍ය වැවිලි සංස්ථාව මගිනුයි. සම්පූර්ණයෙන් ආණ්ඩුවේ ආධාර ඇතිව තනා තිබෙන තේ කර්මාන්තශාලාවේ පාලනයේ තිබෙන දුර්වල තත්ත්වය කෙසේද කිවහොත්, ලොකු කොම්පැනිවලින් ණය මුදල් ගෙන පොලී ගෙව ගෙවා සාදන ලද කුඩා කර්මාන්ත ශාලාවලින් අමු දළු සඳහා ගෙවන මුදල ආණ්ඩුවේ ජනපදයේ තිබෙන කර්මාන්ත ශාලාවෙන් ගොවීන්ට ගෙවන්න බැරිවීමයි. ආණ්ඩුවේ ජනපදයේ ගොවීන්ගේ තේ වතුවල අස්වැන්න නැතුවා පමණක් නොව, ඔවුන්ට හිරිහැර රාශියකට මුහුණ පාන්නට සිදු වනවා පමණක් නොව, ආණ්ඩුවේ ආධාර නියම වේලාවට ඔවුන්ට ලැබෙන්නෙ නැති නිසා ආණ්ඩුවේ තේ කර්මාන්ත ශාලාව ඔවුන්ගේ තේ දළු ටික බලහත්කාරයෙන් ලබාගන්නවා. ගොවීන්ට ඒ සඳහා ලැබෙන්නේ අනික් කර්මාන්ත ශාලාවලින් ගෙවන මුදලට වඩා අඩු මුදලක්.

එපමණක් නොවෙයි, නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් තිබුණ එක්තරා ක්‍රමයක් දැන් අත්සිටුවා තිබෙනවා. මා හිතන හැටියට උස් බිම් ජනපද සම්පූර්ණයෙන් නැති කිරීම ඉඩම් ඇමතිතුමාගේ ප්‍රතිපත්තියක් වෙන්න ඇති. පළමුවෙන් තිබුණ ක්‍රමය නම් තේ දළු ටික ආණ්ඩුවේ කර්මාන්තශාලාවට ගෙනා විට ඒ තේ දළු සඳහා ගෙවිය යුතු මුදලෙන් කොටසක් ගොවියා අතට නොදී නතර කර ගැනීමයි. එසේ කරන්නේ ගොවියාට අවශ්‍ය පෝර අවුරුද්ද අවසානයේදී ලබා දීම පිණිසයි. එතකොට ගොවියාට එයින් යම්කිසි සහතික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

යක් තිබෙනවා, අවුරුද්දකට වරක් ඔහුට අවශ්‍ය රසායනික පෝර ටික ලැබෙනවාය කියා. ඒ මොකද මසින් මස අනු ක්‍රමයෙන් මුදලක් ඉතුරු කරගෙන තිබෙන නිසා. එහෙත් දැන් ඇමතිවරයා ගොවියාගේ නිදහස් ප්‍රතිපත්තිය අකුරටම පිළිපදිනවා. ඒ කෙසේද? සෑම මසකම ගොවියා ගෙන එන තේ දළුවලට ගෙවිය යුතු සම්පූර්ණ මුදල ශතයක්වත් ඉතුරු කරගන්නෙ නැතුව ඔහුට දෙනවා. අවුරුද්ද අවසානයේදී ගොවියාට කියනවා, මුදල් ගෙව්වොත් පමණයි පෝර ටික ලබා ගන්න පුළුවන් කියා. ඒකෙන් සිදු වුණේ ගොවියා අමාරුවට පත්වීමයි. විශෙෂයෙන් තේ දළු මිල පහත ගිය කාලයේ ගොවීන් තමන්ට ලැබුණ මුදල එදිනෙදා ජීවිකාව සඳහා වියදම් කළ නිසා අවුරුද්ද අන්තිමට පෝර ටික ලබාගැනීමට ක්‍රමයක් නැති වුණා. පෝර නොලැබීම හේතුකොටගෙන ඊළඟ අවුරුද්දේ ලැබුණ දළු ප්‍රමාණය භයානක ලෙස පහත වැටුණා. ඔය විධියට අද අක්කර දෙකක් පමණක් තේ වගා කරමින් ජනපදවල ජීවත් වන ගොවීන් ජීවත් වන්න බැරි තත්ත්වයකට පත් වී සිටිනවා. මීට ප්‍රධාන හේතුව මොකක්ද? මා පැහැදිලි වශයෙන් ප්‍රකාශ කරනවා, ගොවි ජනපදවල උස් බිම් වගාව—තේ වගාව—සම්පූර්ණයෙන් නැති කර ධනපති ක්‍රමය අනුව විශාල ධනපතීන්ට තේ වගාව සම්පූර්ණයෙන්ම අයත් කිරීමේ ප්‍රතිපත්තියක් තහවුරු කිරීමක් මෙයින් සිදු වී තිබෙන බව. මේ කටයුතු සිදු වන ලකුණු අනුව අපට පෙනී යන්නේ ඒ තත්ත්වයයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

නැත්නම් ලොකු ධනවතුන්ගේ වතුවල රිකිලි තේ ඉන්දා තේ රාත්තල් 1500 ක් ලබා ගැනීමට කම්කරුවන්ට පුළුවන් නම් ජනපද ගොවිපළේ ඇති අක්කර දෙකේ ඉඩම් කොටස්වල රිකිලි තේ වවා ඊට වඩා ආදායමක් ඒ ජනපදවාසීන්ට ලබා ගන්නට පුළුවන් ක්‍රමයක් යොදන්න බැරි ඇයි? ගොවීන්ට වැඩි ආදායමක් ලබා ගන්නට හැකි වන අන්දමට ඔවුන්ට නවීන ක්‍රමයට ගොවිතැන් කිරීමට ආණ්ඩුව ආධාර නොදෙන්නේ ආණ්ඩුව ධනපති ක්‍රමය අනුව කටයුතු කරන නිසා මිස වෙන කරුණක් නිසාය කියා අපට හිතා ගන්නට පුළුවන්ද?

මා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ ඉඩම් සංවර්ධන සංශෝධන පනත ගොවියා මර්දනය කිරීමට යොදවන මර්දන නීතියක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව නවත්වනවා.

අ. භා. 5.52

**ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා. (පැල්මඩුල්ල)**
*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மதுல்ல)*
(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු තිස් ගණනකට පසු මේ රටේ ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය අද රටේ ප්‍රශ්න විසඳීම පිණිස ප්‍රමාණවත් නොවන බව අපි පළමුවෙන් ප්‍රකාශ කරනවා. මේ පනතින් සංශෝධනය කරන්නට බලාපොරොත්තු වෙන්නේ රජය සතු ඉඩම් බෙදා දීමේ ක්‍රමය පමණක් බව පෙනෙනවා. එහෙත් උඩරට සහ මැදරට ප්‍රදේශයේ කඳු මුදුන්වල විශාල වතු වවාගෙන සිටින ධනපති සමාගම් හිමියන් ඉතාමත් නොසැලකිලිමත් අන්දමින් ඒ වතු පාලනය කිරීමේදී පොළොව සෝදා පස ගසාගෙන යනවා. එය වැළැක්වීම සඳහා මේ පනතින් කිසිම පියවරක් ගෙන නැතිවා පමණක් නොව, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සබරගමුව වර්ෂාධික ප්‍රදේශයක්. එහි කඳු මුදුන්වල වගා කරගෙන සිටින ධනපතියන්ගේ වතු සෝදා පාළු වීම නිසා එහි ගොවි ජනතාවට ලොකු විපතකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ධනපතියන්ගේ රජයක් බලයට පත් වී සිටින නිසා ඔවුන් අද ගම්බද ගොවීන්ගේ ගොවිතැන් ව්‍යාපාර ගැන හෝ වාරිමාර්ග ගැන කිසිම සැලකිල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක් දක්වන්නේ නැහැ. මෙම වතුවලින් වතුර පාරවල් ගලා ඒම වැළැක්වීම සඳහා මීට පෙර කාලවල නම් බැමි ආදිය බැඳ තිබුණා. එහෙත් මේ රජය වතු හිමියන්ගේ අතේ නිසා ඔවුන් දන් ගම්බද වාරිමාර්ග ක්‍රම ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මේ හේතුව නිසා ඇළ වේලි ගොඩ වීමෙන් සබරගමු ප්‍රදේශයේ මෙතෙක් ගොවිතැන් කරගෙන ආ බිම් විශාල ප්‍රමාණයක් අද ගොවිතැන් නොකර අත්හැර දමා තිබෙනවා. ඒ වගේම ගංගා පත්ලවල් ගොඩ වීම නිසා ජල ගැලීම්ද ශීඝ්‍රයෙන් වැඩි වී තිබෙනවා. මෙවැනි ප්‍රශ්න වලදී රජයක් ඇස් කන් පියාගෙන සිටිනවා නම් එය ලොකු අභාග්‍යයක් බව ප්‍රකාශ කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සබරගමු ප්‍රදේශයේ අක්කර සිය දහස් ගණන් විශාල ඉඩම්, කොටස් වශයෙන් බෙදී යාම නිසා ඉඩම් සංවර්ධනයට ලොකු බාධාවක් ඇති වීගෙන යනවා. ඒ නිසා ඉඩම් කොටස් වශයෙන් බෙදී යන්නට ඉඩ නොදී ඒවා විශාල ඉඩම් වශයෙන් සංවර්ධනය කරන්නට රජය යම්කිසි ක්‍රියාමාර්ගයක් යෙදිය යුතුයි. අවුරුදු තිස් ගණනකට පසු ගෙනා මේ පනතින් එවැන්නක් ගරු ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ අවධානයට යොමු නොවීම කනගාටුවට කාරණයක් බව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ බොහොමයක් ඉඩම් විහාරගම්වලටත්, දේවාලගම්වලටත් යටත්ව පවතිනවා. විජාතික වතු සමාගම් කරුවන් ඒවායින් බොහොමයක් බදු ගෙවීමේ ක්‍රමයට අරන් තිබෙනවා. ඔවුන් ඒ ඉඩම්වලින් සුළු ප්‍රමාණයක් වගා කර ඉතිරි කොටස වගා නොකර තිබෙන්නට හැර තිබෙනවා. ඒ විධියේ ඉඩම් අක්කර දහස් ගණනක් තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන් බදු වශයෙන් ගෙවන්නේ සිලිම් තුනක් නැත්නම් රු. 2ක් වැනි සුළු මුදලක් පමණයි. මෙවැනි ඉඩම්වල පදිංචි ගම්බද ගොවීන්ට ඒවායේ අවුරුද්දකට වැඩි දීර්ඝ කාලීන ගොවි කර්මාන්ත ව්‍යාපාරයක් ගෙන යන්නට බැහැ. දීර්ඝකාලීන වැඩිල්ලකට ඒ ඉඩම් යොදා ගත හැකි ක්‍රමයක් වහාම රජයෙන් ඇති කළ යුතුයි. එසේ නොකිරීමෙන් ඒ ඉඩම් ක්‍රමයෙන් නිසරු වෙනවා. ඒවා සංවර්ධනය වන්නේ නැහැ. ඒවායේ පදිංචි දුප්පත් මිනිසුන්ට ඒ සම්බන්ධයෙන් කර කියා ගතහැකි දෙයක් නැති බව ඉඩම් සංවර්ධන ඇමතිතුමාගේ කල්පනාවට භාජන කරනු පිණිස මතක් කරන්නට කැමතියි.

උස්බිම්වල ඉඩම් සංවර්ධනය සම්බන්ධයෙන් රජය අද ගෙන යන ප්‍රතිපත්තිය නිසා රජයටත් ඉඩම් ලැබූ කට්ටිකරුවන්ටත් කරදර අවස්ථා පැමිණෙන බව පැහැදිලියි. ඉඩම් කට්ටිකරුවන් තෝරා කැලෑ ඉඩම් බෙදා දෙනවා. ඉඩම් වගා කිරීමේදී ප්‍රධාන වශයෙන් බලපාන්නේ පාරවල් වුවත් ඒ ගැන රජය ඇස් යොමු කරන්නේ නැහැ. ඉඩම් වවා ඉවරවෙලා කට්ටිකරුවන් තමන්ගේ ප්‍රයෝජනය ගැන සලකා පාරවල් හඳන්නට යෑමෙන් හොඳට වගා කරන ලද ඉඩම් පවා නිකරුණේ විනාශ වන්නට යනවා. පාරවල් පිළිබඳ ප්‍රශ්නය කල් තබා නොවිසඳීම නිසයි මෙසේ සිදු වන්නේ. ඒ නිසා හරියාකාර ප්‍රයෝජන ලබන්නට නම් මුලින්ම පාරවල් දමා ඊළඟට ඉඩම් බෙදා දීමේ ක්‍රමය අනුගමනය කළ යුතු බව මතක් කරන්නට කැමතියි.

උස් බිම්වල තේ වගා කිරීමේ ව්‍යාපාරය යටතේ කට්ටිකරුවන්ට අද තේ ඇට බෙදා දෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ගේ මාර්ගයෙනුයි. ඒ නිසා අද කට්ටිකරුවන්ගේ ඉඩම්වල තිබෙන තේ පැලවලින් සියේට අසූවක් පමණ නිසරු ඒවා වී තිබෙනවා. මේ වර්ගයේ තේවල පලදාව ඉතාමත් අඩුයි. ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමය අනුව උස්බිම්වල පදිංචි කට්ටිකරුවන් පමණ දුක්ඛදායක ජීවිත ගත කරන්නන් තවත් නැතැයි කියන්නට පුළුවනි. ඒ අයට ජීවත් වන්නට අද සිදු වී තිබෙන්නේ ඉතාමත් අසරණ තත්ත්වයකයි. ඒ ප්‍රදේශවල මිනිසුන් ජීවත් වන්නේ ඉතා අපහසුවෙනුයි. ජල පහසුකම් නැතිව, ගමනාගමන පහසුකම් නැතිව, නිවාස පහසුකම් නැතිව, අධ්‍යාපන පහසුකම් නැතිව ඉඩම් අක්කරයක් දී කිසිම වග විභාගයක් නැතිව නිකම්ම ප්‍රදේශයකට ගෙනගොස් දැමීම නිසා එසේ ඉඩම් ලැබූ අය ගත කරන්නේ ඉතාමත්ම දුක්ඛදායක ජීවිත බව ගරු ඇමතිතුමාට මතක් කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධම්දස මයා.]

ඒ නිසා ඔවුන්ගේ දියුණුව පිණිස සුදුසු වැඩ පිළිවෙළක් යෙදිය යුතු බව මතක් කරන්න ඕනෑ.

අනික් කරුණ ගංවතුර විපතින් බේරීම සඳහා උස් බිම්වල පදිංචි කරවීමයි. ගරු ඇමතිතුමා දන්නවා ඇති, එතුමා පසුගිය රජයේ ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටියදී හකමුව හා මුද්දුව යන ගම්වල අවුරුදු පතා ගංවතුර නිසා අනාථ වන දහස් ගණන් පවුල්වලට සහනය පිණිස මුද්දුව වත්ත කියන ඉඩම රජයට ගෙන බෙදා දීමට යෝජනා ක්‍රමයක් ඇති කළා. ඒ ගම්වල ගංවතුරින් යට වන අයට කළ හැකි එකම සහනය එයයි. එමෙන්ම ඒ සඳහා දිය හැකි එකම ඉඩමත් එයයි. යම් පිරිසකට ඉඩමක් දිය යුතු නම් ඒ අය කරන රක්ෂාවල හැටියටත් ජීවත්වන ප්‍රදේශයේ හැටියටත් සුදුසු ඉඩමක් දෙන්නට ඕනෑ. කරන රැකීරක්ෂා ඒ අන්දමින්ම කරගෙන යන්නට හැකි වන පරිදි ඉඩමක් දෙන්නට ඕනෑ. එමෙන්ම ගංවතුර නිසා අවුරුදු පතා ඒ ගම්වල අය වෙනුවෙන් මහජන මුදලින් රුපියල් දහස් ගණනක් වැය කරන්නට සිදු වී තිබෙන බවත් ගරු ඇමතිතුමා දන්නවා. ඒ නිසා ගම් වැසියන්ට බෙදාදීම පිණිස 1963 පෙබරවාරි 9 වැනිදා ගැසට් නිවේදනයක් මගින් අත්කර ගත් එම ඉඩම අක්කරය බැගින් කැබලිවලට කඩා, ගල් දමා, රු. 13,000 ක පමණ මුදලක් වියදම් කර මහජනයාට බෙදාදීම සඳහා අවශ්‍ය සියලු කටයුතු අවසාන කළාට පසුව 1965 දී මේ රජය බලයට පත්වීමෙන් පසු එම අත්පත් කර ගැනීම ගරු ඇමතිතුමා විසින්ම අවලංගු කර දමා නැවතත් එම ඉඩම හිමියාට ඕනෑ විධියට වගා කරන්නට ඉඩ දුන්නා. ඒ නිසා අද ඒ ගම්වාසීන්ට ගෙවල් හදාගෙන ජීවත් වීමට ක්‍රමයක් නැතිව සිටින බව මා ගරු ඇමතිතුමාගේ දැන ගැනීම සඳහා මතක් කරන්නට කැමතියි. මේ රජය හෝ වේවා මතු ඇති වන රජයක් හෝ වේවා පිළිගත යුතු දෙයක් නම් හකමුව මුද්දුව ගම්වාසීන්ට ජීවත් වීමට ඇති එකම ඉඩම මේ මුද්දුව වත්ත කියන ඉඩම බවයි. ගරු ඇමතිතුමා එක ධනපතියකුගේ ඉල්ලීමක් උඩ එම ඉඩම අත්පත් කරගෙන ගම්වාසීන්ට බෙදා දීම අතපසු කර දැමීම ගරු ඇමතිතුමාගේ තත්ත්වයට හෝ ගරුත්වයට කිසිසේත්ම වටිනවාය කියා මා හිතන්නේ නැහැ. දැන් මිනිසුන්ගේ ඉල්ලීම් මගහැරීම පිණිස හැතැප්ම ගණනාවකට ඈතින් තිබෙන රජය සතු කඳු මුදුන් සහිත ප්‍රදේශයකින් ඉඩම් කොටස් ඒ අය අතරේ බෙදා දීමට අදහස් කර තිබෙනවා. නගරබද රැකියාවල් කරන අයට හැතැප්ම ගණන් ඈතින් තිබෙන, වතුර ටිකක් වත් නැති කඳු මුදුන්වල තිබෙන ඉඩම්වලින් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. ඒ ප්‍රදේශවල ගෙවල් සාදා ගැනීමෙන් ඔවුන්ට කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මා හිතන හැටියට කච්චිකරුවන් තුන් දෙනෙක් පමණයි එම ඉඩම් භාර ගැනීමට කැමැත්ත දක්වා තිබෙන්නෙ. මා මේ සම්බන්ධයෙන් මීට ප්‍රථම ලිපියකිනුත් ඇමතිතුමාට දන්වා ඇති. ඒ නිසා මේ කාරණය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

මේ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමය අනුව කච්චිකරුවන් අතර ඉඩම් බෙදා දීමේ ක්‍රමය ඒ තරම් නුවණට හුරුය කියා සිතන්න අමාරුයි. මේ කච්චිකරුවන් තෝරන ක්‍රමය අනුව කවදාවත් ඒ සඳහා නියම සුදුස්සන් තේරෙනවාය කියා සිතන්න බැහැ. සුදුස්සන් මගහැරී නුසුදුස්සන් තේරීමයි වැඩියෙන් කෙරෙන්නෙ. ප්‍රදේශයේ ග්‍රාම සේවක මහතාගෙන් හෝ එතන සිටින වෙනත් අයගෙන් ප්‍රසිද්ධියේම අහනවා මේ මේ අයට ඉඩම් තිබෙනවාද නැද්ද, ඒ අයට ඉඩම් ලබා දීම සුදුසුද නැද්ද ආදී වශයෙන්. දිසාපතිතුමා හෝ ඒ වෙනුවට යන මහත්මයෙක් විසිනුයි ඒ කටයුතු කරන්නෙ. ඒ කිසිම කෙනෙක් කැමති වන්නේ නැහැ කිසිවෙකුගේ හිත රිද්දවීමට. ඒ නිසා යම් කෙනෙකුට ඉඩම් තිබුණත්, ඒ පුද්ගලයාට ඉඩම් තිබෙනවාය කියා කියන්න කැමති වන්නෙ නැහැ. අන්න ඒ හේතුව නිසා මේ කච්චිකරුවන් තේරීමේදී බොහෝ විට සුදුස්සන් මගහැරී නුසුදුස්සන් තේරෙන බවක් පෙනෙනවා. බොහෝ විටම සිදු වන්නේ සුදුසු අය මගහැරීමයි. ඒ නිසා නිලධාරීන්ට යම්කිසි කාල සීමාවක් ලබා දෙන්න ඕනෑ; ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ පසු ඒ ඒ අය ගැන වෙනම වාර්තා කිරීමට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන්ට නැත්නම් ග්‍රාමසේවක මහත්වරුන්ට කල් දෙන්න ඕනෑ. එහෙම නැතිව ඒ අවස්ථාවේදීම ඒ ඒ අයට ලකුණු දී සුදුසු අය තෝරන්න යාමෙන් සිදු වන්නේ නුසුදුස්සන් තේරී සුදුස්සන් පසෙකට තල්ලු වීමයි. ඉඩම් ලබා දීමේදී බොහොම ලොකු සුදුසුකමක් වශයෙන් අද සලකන්නේ පවුලේ සිටින දරුවන් ගණන අධික වීමයි. දරුවන් හතර පස් දෙනෙක් නැත්නම් හත් අට දෙනෙක් සිටින පවුලකට ඉඩම් අක්කරයක් පවරා දුන් විට ඒ දරුව නුත් නඩත්තු කර ගනිමින් ඒ ඉඩම වැඩි දියුණු කර ගැනීම අපහසු කරුණක් විය හැකියි. ඒ නිසා මෙසේ ඉඩම් බෙදා දීමේදී දරුවන් සිටින ප්‍රමාණය ගැනම නොසලකා යමක් කරන්න පුළුවන් අය තෝරා ගත යුතුයි. ඒ නිසා පළාත් පාලන ආයතන මගින් හෝ වෙනත් නිලධාරියෙකු විසින් අනුමත කරන ලද තරුණයින්ට ඒ වාගේම දරුවන් අඩු අයට ඉඩම් ලබා දීමට විධිවිධාන යෙදිය යුතුයි. රට සංවර්ධනය සඳහා කටයුතු කරනවා නම් ඒ අන්දමට වැඩ කළ යුතුයි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් ලබා ගෙන සිටින අයට අනියම් සහනාධාර ආදිය ලබා ගත නොහැකි තත්වයක් තිබෙනවා. එය පුදුම දෙයක්. තමන්ගේ පුද්ගලික ඉඩම්වල පදිංචි වී සිටින අයට ගංවතුරින්, සුළඟින් නැත්නම් ගින්නකින් යම් උවදුරක් සිදු වුවහොත් අනියම් සහනාධාර ලබා ගත හැකියි. නමුත් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් ලබා ගෙන පදිංචි වී සිටින අයට ඒ අනියම් සහනාධාර ගෙවීමක් සිදු වන්නේ නැහැ. රත්නපුර දිස්ත්‍රික්කයේ නම් එය කෙරෙන්නේ නැහැ. ඒ වගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනියම් සහනාධාර ලැබිය යුතු අයට ඒවා ලබා ගැනීමට අපහසු වීමට තවත් කරුණක් නම් ඒ ඒ අය මොන දේශපාලන පක්ෂයට හිතවත්ව කටයුතු කරනවාද කියා සොයා බැලීමයි. විපතට වැටුන මිනිසෙකුට ආධාර කිරීමේදීත් දේශපාලන හේතූන් බලපාන තත්වයක් අද ඇති වී තිබෙනවා. මගේ ආසනයේ මාරපන ප්‍රදේශයේ අක්කර දෙකක ඉඩමක් නාය යාමකට ගොදුරු වුණා. එම ඉඩම ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා ගෙන තිබෙන්නේ ජේ. පී. බී. පුංචි මහත්මයා නමැති පුද්ගලයා විසිනුයි. යාබදව තිබෙන කොම්පැනි වත්තත් සමග නාය යාම නිසා අක්කර 50 ක පමණ වෙල් යායක් දූන් යට වේගෙන යනවා. පුංචි මහත්මයාගේ ඉඩමෙන් දෙකෙන් පංගුව කට වඩා දූන් නාය ගොස් අවසානයි. මේ තැනැත්තා දුප්පත් කම්කරුවෙක්. එහෙත්, ඔහු රු. 125 ක වේතනයක් ලබන බවට කවුදෝ කළ රෙකමදාරුවක් නිසා මොහුට මහජනාධාර දීමත් අනියම් සහනාධාර දීමත් නතර කර තිබෙනවා. ඔහුගේ ආදායම සොයා බැලීමට නම් ඔහුගේ ස්වාමියාගෙන් ඒ ගැන විමසිය යුතුයි. එහෙත්, එසේ නොකර, ඔහු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයකු වුණු පලියට ඔහුට ආධාර ගෙවීම නතර කර තිබෙනවා. මේවා සාධාරණ රජයක යුතුකම්දැයි කල්පනා කළ යුතුයි. ඔහුට ඉඩම් අක්කර බාගයක් දෙන බව කියා ඒ සඳහා මුදල් අය කර ගෙන ඇති නමුත් එයවත් තවම ඔහුට ලැබී නැහැ.

ඊළඟට මා මෙම පණතේ 9 වන ඡේදය ගැන වචනයක් කිව යුතුයි. එහි මෙසේ සඳහන් වෙනවා :

> " මේ ආඥාපනත යටතේ රජයේ ඉඩම් සතුකර දිය යුතු තැනැත්තන් තේරීම ඉඩම් කච්චේරියකදී කළ යුතුය ;
>
> එසේ වුව ද නියම කරනු ලැබිය හැකි යම් අවස්ථාවලදී ඉඩම් කච්චේරියකදී නොව අන් ලෙසකින් ඒ තේරීම කළ හැකිය."

" අප විසින් ඉදිරිපත් කර සිටින අපේක්ෂිකාව දිනුවොත් බඹරකොටුවේ හපුගස් තැන්න වත්ත නුඹලාට බෙදා දෙනවා" යි අපේ මේ ගරු ඉඩම් ඇමතිතුමා පැල්මඩුල්ලේ අතුරු මැතිවරණ කාලයේදී වේදිකාවලට නැග ප්‍රකාශ කළා.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
නෑ, නෑ ; එහෙම කිව්වේ නැහැ.

**ධර්මදාස මයා.**
*(திரு. தர்மதாச)*
(Mr. Dharmadasa)
එහෙත් ඒවා කෙරුණේ නැහැ. එම නිසා, මෙවැනි පරිසරයක් යටතේ අපට මේ පනතට අනුමැතිය දෙන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක් නැහැ. "අප දිනුවොත් අසුවල් වත්ත බෙදා දෙනවා, අසුවල් කැළය බෙදා දෙනවා, අසුවල් කන්ද බෙදා දෙනවා" යි කියමින් මහජනයා මුළා කිරීමට මීළඟ මැතිවරණයකදී මේ ගරු ඇමතිතුමා උත්සාහ කරනවා ඇති. ඒවාගේම රජය සතු ඉඩම් ඇමතිතුමාගේ ඕනෑ එපාකම් අනුව අත්තනෝමතිකව බෙදා දීමටත් එතුමාට මෙයින් බලය ලැබෙන බව පෙනෙනවා. එම නිසා, අවසාන වශයෙන්, මේ පනතට අප විරුද්ධ බව ප්‍රකාශ කරමින් මා නවතිනවා.

අ. භා. 6.15

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන පනත ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මා නැගී සිටින්නේ, මෑත කාලය තුළදී මේ ඉඩම් ප්‍රශ්නයත් ඉඩම් සංවර්ධන ප්‍රශ්නයත් ගැන වෙනදාට වඩා කල්පනාව යොමු කරන්නටත්, හිත දෙන්නටත්, ඒ ගැන ක්‍රියාත්මක දැනීමක් ලබා ගන්නටත්, අගලවත්තේ මන්ත්‍රී වශයෙන් මට සිදු වුණු බවත් ඉඩ ලැබුණු බවත් ප්‍රකාශ කරමිනුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Whereupon* Mr. Deputy Speaker *left the Chair, and* Mr. Deputy Chairman of Committees [Mr. G. J. Paris Perera] *took the Chair.*

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ ඉඩම් සංවර්ධන ක්‍රමය සෑහෙන කාල පරිච්ඡේදයක් මුළුල්ලේ සකස් කර පාලනය කර තිබෙන්නේ එකම ප්‍රතිපත්ති පෙළක් අනුව බව මේ ගරු සභාවත්, රටත් දන්නා වූ දෙයක්. සාමාන්‍යයෙන් එම ප්‍රතිපත්ති පිළියෙළ කළ ප්‍රධාන පුද්ගලයා ඩී. එස්. සේනානායක මැතිතුමා හැටියට පිළිගත්තේ වී නමුත් මා දන්නා හැටියට ඒ අලුත් ක්‍රමය ගැන කල්පනාකාරයා වශයෙන් මුලින්ම අප පිළිගත යුතුව තිබෙන්නේ විදේශික ආණ්ඩුකාරයකු වූ හියු ක්ලිපර්ඩ් මහතායි. ගරු ඩී. එස්. සේනානායක මහතාට ලැබිය යුතු ගෞරවය නැති කිරීම පිණිස නොවෙයි, මා එසේ සඳහන් කළේ; අපේ ඉතිහාසය මතක් කර දීම සඳහායි. මගේ විශ්වාසයේ හැටියට, ගරු ඩී. එස්. සේනානායක මහතාගේ එම ඉඩම් ප්‍රතිපත්තිය එක්තරා ප්‍රමාණයකට අකල්පනාකාරීව පිළිගත් ප්‍රධානියකු මේ රටේ ඉන් පසුව සිටියා නම් ඔහු ඩී. එස්. සේනානායක මැතිතුමාගේ පුත්‍ර රත්නය නොව, දැන් සිටින ඉඩම් සංවර්ධන ඇමතිතුමා බව ප්‍රකාශ කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩු කොයි ආකාරයෙන් වෙනස් වුණත් අවුරුදු 12 ක පමණ කාලයක් තිස්සේ මේ රටේ ඉඩම් සංවර්ධන කටයුතු තමන් අතේම තබා ගත් මේ ඇමතිතුමා ඩී. එස්. සේනානායක මැතිතුමාගේ එම ප්‍රතිපත්තියට ගරු කිරීමක් නාමයෙන් කෙරුවේ වී නමුත් එය සැලකිය යුතු විධියට වෙනස් වන සහ හීන වන ආකාරයට පාලනය කර තිබෙන බව පිළිගත යුතුව තිබෙනවා. ඒ කාලයේදී, එක් දහස් නවසිය තිස් එකට පසුව, විශේෂයෙන්ම එක් දහස් නවසිය තිස් පහ තිස් හත කාලයේදී, මුලින්ම නීතිගත කළ ඉඩම් සංවර්ධන නීතියේ නැති නම් පනතේ ප්‍රතිපත්ති වශයෙන් තිබුණේ කුමක් ද කියා තරමක් පුළුල් ලෙස කල්පනා කර බැලීමෙන්, මතක් කිරීමෙන් පමණයි, අද ඉදිරිපත් කර ඇති සංශෝධිත පනත පිළිබඳව මගේ අදහස් යම්කිසි ප්‍රයෝජනවත් ආකාරයෙන් ඉදිරිපත් කරන්න මට පුළුවන් වන්නේ. කෙටියෙන් කියතොත්, ඒ කාලයේදී මේ රට පාලනය කරන්නාවූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රධානීන් අතරේ විශ්වාසයන් කීපයක් තිබුණා. එකක් නම්, ඉඩම් සංවර්ධනයේදී පෙසන්ට් යනුවෙන් හැඳින්වූ, ගොවීන් වශයෙන් භාවිතා කරන, එම සමාජ තීරුව ආරක්ෂා කර දියුණු කිරීම අරමුණ කර ගනිමින් කටයුතු සකස් කළ යුතුය කියන අදහසයි. ඉඩම් සංවර්ධනයෙදී විශේෂයෙන්ම කල්පනාවට ගත යුත්තේ ගොවීන් ඇති කිරීම, ගොවීන් ආරක්ෂා කිරීම සහ ගොවීන්ගේ අයිතිය සහ දියුණුව වර්ධනය කිරීම යන කාරණායි. ඒ සමගම තවත් විශ්වාසයක් එදා සිටි ලොකු අය අතරේ ධනවත් අය සහ පාලකයන් අතරේ තිබුණා. එනම්, සාමාන්‍යයෙන් ලාංකික ගොවියා නාස්ති කාරයකු මෙන්ම ඉඩම් ආරක්ෂාකර ගන්නට නොදන්නා, ප්‍රමාණවත් හේතුන් නැතුව, හිතුමතයේ ඉඩම් නැති කර ගන්නාවූ පුද්ගලයකු හැටියට විශ්වාසයක් තිබුණා. මෙසේ කල්පනා කළේ, තමන්ගේ විශාල ඉඩම් පිට පිට හෙට්ටිරාළලාට බැඳ, එක් දහස් නවසිය තිස් ගණන්වලදී, ආණ්ඩුවේ නීතිවල ආරක්ෂාවෙන් එම ඉඩම් බේරා ගත්ත සිදු වුණු මහ ධනපතීන්. ඒ ගැන මෙතැන වැඩි පුර කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් ඒ විශ්වාසය තිබුනා. ඒ නිසා ඊ ළඟට මෙහෙම අදහසක් විශේෂයෙන් පිළිගන්නට යෙදුණා: ගොවියා දියුණු කරන්නට නම් ගොවියා, ගොවියාගෙන්ම ආරක්ෂා කර ගත යුතුය; බේරා ගත යුතුය කියා. පැහැදිලිව, ලුහුඬින් මෙහෙම කියන්නට පුළුවන්: ගොවියා නාස්ති කාරයෙක්. ගොවියාට තිබෙන ඉඩම ගොවියා ලෙහෙසියෙන් උගසට බැඳ නැති කර ගන්නවා; විකුණනවා; කෑලිවලට කඩා නැති කර ගන්නවා; ඒ ඉඩමේ වගාව හරියට කරන්නෙ නැහැ. ඒ නිසා ගොවියාට තම ඉඩම ගැන තිබෙන්නාවූ නිදහස නැති ඉඩම් ක්‍රමයක් ඇති කරන්නට පුළුවන් නම්, ඒ අන්දමට ඉඩම් අයිති ක්‍රමයක්, ඉඩම් පාවිච්චි කරන ක්‍රමයක් ඇති කරන්නට පුළුවන් නම්, land tenure ක්‍රමයක් ඇති කරන්නට පුළුවන් නම් එය කළ යුතුය.

ගොවියාගේ වැරදි නීතියෙන් නැති කර ගොවියා ආරක්ෂා කර දීමටයි, එසේ කල්පනා කළේ. මනුෂ්‍යයා නීතියෙන් හොඳ කරන්නටයි ඒ අදහස් කළේ. ඒක කරන්නට බැරි වැඩක්. අප මනුෂ්‍යයන් හොඳ කරන්නට මිනී මැරීමට විරුද්ධව නීති හදා තිබෙනවා. ලංකාවේ එයින් කොයි තරම් හොඳ ප්‍රතිඵල ඇති වී තිබෙනවාද කියනවා නම්, අවුරුද්දෙන් අවුරුද්ද මිනී මැරීම් ප්‍රමාණය වැඩි වෙනවා. මිනිසකුගේ ඉඩම නීතියෙන් ආරක්ෂා කර දෙන්නට පුළුවන්ය කියා හිතීම ඊට වඩා සැරයි. එහෙත් 1935 දී හෝ 1937 දී ඒ ක්‍රමය මුලින්ම ඇති වුණා. ඒ ක්‍රමය අනුව ආණ්ඩුවේ ඉඩම් බෙදා හැරීමේදී ප්‍රධාන වශයෙන් ඒවා දෙන්නේ පුංචි ගොවීන්ටයි. ඒ ඉඩම් දෙන්නට නීතියෙන් දෙවිධියක් සකස් කර තිබුනේ වී නමුත් එදා සිට අද දක්වා ප්‍රධාන ලෙස පාවිච්චි කර ඇත්තේ එක ක්‍රමයයි. ගොවියාට සම්පූර්ණයෙන්ම ඉඩම අයිති වන අන්දමට ඉඩම් දෙන්නට පුළුවන් පැත්තක් තිබුනත්, ඇත්ත වශයෙන්ම ඒ පැත්ත ක්‍රියාත්මක කළේ නැහැ. ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක කළේ වෙනින් පැත්තක්. එක්තරා සීමාසහිත අයිතිවාසිකමක් තිබෙන ආකාරයට ගොවීන්ට ඉඩම් දීමේ ක්‍රමයයි, ක්‍රියාත්මක කළේ. විශේෂයෙන් තිබුනේ, ගොවියාට ලැබෙන ඉඩම් කැබෙල්ල බෙදී යාම වැලැක්වීමේ කොන්දේසියයි. අනික් කොන්දේසිය නම් ගොවියාට ලැබුණු ඉඩම් අන්සතු වීම තහනම් කිරීමයි. තමාට තිබෙන්නාවූ ඉඩම් කැබෙල්ල විකුණන්නට, බදු දෙන්නට, නොයෙක් විධිවලට අන්සතු කරන්නට ගොවියාට කොයි තරම් ආශාවක්, වුවමනාවක් තිබුණත් එය තහනම් කිරීම මේ නීතියේම කොන්දේසියක් වුණා.

අපේ රටේ ඉඩම් උරුමය පිළිබඳ නීතියේ තිබෙන්නාවූ විශේෂ ලක්ෂණය හෝ ගතිගුණය මෙයයි. ඕලන්දක්කාරයන්ගේ නීති ක්‍රමය මේ රටේ සාමාන්‍ය නීතිය හැටියට පිළිගන්න නිසා ඕලන්දක්කාරයන්ගේ බූදල් වීමේ ප්‍රතිපත්තිය අප පිළිපදිනවා. එයින් සිදු වන්නේ මෙයයි. කෙනකු මැරුණාම ඔහුගේ බූදලය දෙකට බෙදෙනවා. එයින් දෙකෙන් පංගුවක් ඒ අයගේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට අයිති වෙනවා. අනෙක් කොටස එයාගේ දරුවන්ට සමසේ අයිතිවෙනවා. තවද ඒ භාර්යාව/ස්වාමිපුරුෂයා මැරුණමත් ඒ අයගේ බූදලයත් අර විධියටම බෙදී යනවා. මා දෙවනුව [illegible] කළ භාර්යාව/ස්වාමිපුරුෂයා අන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

තිම කැමැත්ත නොදක්වා මැරුණා නම් ඒ බූදලය ඉබේම අයිති වෙනවා, මැරුණ අයගේ හිටපු දරුවන්ට. මේ ක්‍රමය අනුව ඉඩම් ක්‍රමානුකූලව බෙදී යාමක් සිදු වෙතත්, දකුණු සහ බස්නාහිර පළාත්වල එසේ බෙදී යනවා වෙනුවට හවුලේ අයිතිය ගෙන යාමේ සිරිතක් තිබෙනවා. ඒ හවුල වැඩි වන්න වැඩි වන්න අයිතිය පුංචි වෙනවා. මා අධිනීතිඥයකු වශයෙන් කට යුතු කරන්නට පටන් ගත් කාලයේ මුලින්ම මට භාර දුන් බෙදුම් නඩු ඇපෑලක විත්තිකාරයකුට "පෙඩිග්‍රිය"—දැන් එය සිංහල වචනයක් වී තිබෙනවා—නැත්නම් පෙළපත අනුව අයිති වූයේ අක්කරයකින් නොව පොල් ගහකින් 1/1276 යි. මෙය මා අමතක කරන්නේ නැතිව නිතරම මතක් කරනවා.

දකුණු පළාතේ, වැවිලිකරුවන්ගේ අයිතිවාසිකම් කියා එකක් තිබෙනවා. නොයෙක් විධියේ ක්‍රම—ඉංග්‍රීසියෙන් කියනවා නම්, "ටෙනියුරියල් සිස්ටම්ස්"—තිබෙනවා. ඒ අනුව එක විත්තිකරුවකුට අයිතිය තිබුණේ පොල් ගහකින් 1/1276 පංගුවකට පමණයි. ඒ 1/1276 පංගුවේ අයිතිය හැමෝටම පිළිගැන්වීමට වුවමනා තැනදී ඔහු කැත්තක් උස්සාගෙන එන බවට කිසිම අනුමානයක් නැහැ. එම නිසා එයත් නැවැත්වීම සඳහා ඒ ඉඩමේ භාරය පැවරෙන ගොවියාට භාර වන ඉඩම කෙසේ බූදල් විය යුතුද, ඔහු මැරුණ විටෙක එය අනෙක් අයට බූදල් විය යුත්තේ කෙසේද යන්නත් පිළිබඳ විශේෂ නීතියක්, අර ඉඩම් සංවර්ධන ආඥාපනතේ දැක්වෙනවා. එය මා විස්තර කරන්නට වුවමනා නැහැ. ඉඩම අයිති තැනැත්තාට අයිතිවාසිකමක් තිබෙනවා, තමාගේ මරණින් පසු තම භාර්යාව හා දරුවන් වැනි නියමිත පිරිස අතුරින් කොයි එක්කෙනාට අයිති විය යුතුදැයි තීරණය කිරීමට. එවිට ඔහුට වගේම ඉඩම පිළිබඳ තනි අයිතිය ලැබෙනවා, අර නම් කළ තැනැත්තාටත්. මා මෙහිදී "අයිතිය" කියන වචනය පාවිච්චි කරන්නේ, කලින් කියා තිබෙන අර කොන්දේසි සහිත අයිතියට බව මතක් කරන්නට කැමතියි.

මා දෙවනුව ඒ ගැන ටිකක් විස්තර කරන්නට ඕනෑ. මේ නීතියෙන් කරන්නට උත්සාහ කරන්නේ මොකක්ද, ඒ අදහස මේ නීතියෙන් පිරිමැසෙනවාද, කොමිෂන් සභාවක වාර්තාවක් අනුව මේ නීතිය සකස් කර තිබුණත් ඒ අදහස මේ නීතියෙන් පිරිමැසෙන්නේ නැතැයි කියනවා නම් ඒ ඇයිද, කියාත් අප කල්පනා කරන්නට ඕනෑ. අප එතැනට එන්නට ඕනෑ, මා කියූ ප්‍රධාන කරුණු තුන මතක තබාගෙනයි. එතකොට ඒ කාලයේ ඩී. එස්. සේනානායක උන්නැහේගේ එක්තරා අදහසක් හා අරමුණක් තිබුණා. මොන කොන්දේසි උඩ හෝ වේවා, මොන සීමාසහිත අයිතියක් උඩ හෝ වේවා, යම් කෙනකුට පවුලක් නඩත්තු කරමින් දියුණු වීමට ප්‍රමාණවත් ඉඩමක් දිය යුතුය යන්න එතුමාගේ අදහසයි. ඒ ඒ ප්‍රදේශ අනුව ඉඩම් අක්කර දහයක් හෝ අටක් හෝ එක් පුද්ගලයකුට දිය යුතුය කියන අදහස අනුව කටයුතු කරගෙන ආවා. එක පළාතක, උස් බිම් අක්කර පහක් සහ කුඹුරු අක්කර පහක් දෙනවා වන්නට පුළුවනි. තව පළාතක ඊට වෙනස් ඉඩම් ප්‍රමාණයක් දෙනවා වන්නට පුළුවනි. එහෙත් පළල් ලෙස ඉඩම් දෙන ක්‍රමය ඒකයි. ඉඩම් අක්කර අටක් හෝ දහයක් හෝ ලබා ගත් කෙනකුට ආණ්ඩුවේ ආධාරය ඇතිව එම ඉඩම් ප්‍රමාණය දියුණු කරගෙන, දරු මල්ලන් හදාගෙන එක්තරා දියුණුවක් අත්පත් කරගත් මනුෂ්‍යයකු සහ පවුලක් වශයෙන් ජීවත් වන්නට පුළුවනැයි එතුමා කල්පනා කළා.

අද වැදගත් වන්නේ එදා ඒ කල්පනාව හරිද වැරදිද යන්න නොවෙයි. ඩී. එස්. සේනානායක මහතාගෙන් පසුව ඒ ඒ ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරුන් මේ ඉඩම් ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්නය ක්‍රමානුකූලව අමතක කරන්නට පටන් ගත්තා. අද සිටින ඉඩම් සංවර්ධන ඇමතිතුමා හොඳ හිතින් ක්‍රියා කරගෙන ආවා වන්නට පුළුවනි. ඒ ගැන සිංහල භාෂාවේ තිබෙන එක්තරා උපමාවක් මෙතැන කියන්නට බැහැ. එය කියන්නට පුළුවන් නම් ඇත්තෙන්ම එය මෙතැනට යෝග්‍ය කියමනක් වෙනවා. මා එය ඉගෙන ගත්තේ ඩී. එස්. සේනානායක මහතාගෙන්මයි. ඉතින් එදා තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කළා. එසේ නැත්නම් එය වෙනස් වුණා. කොයි ආකාරයටද? ගොවියාට ලැබෙන ඉඩම් කැබෙල්ලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රමාණය එන්න එන්නටම පටු වන්නට පටන් ගත්තා. ඉඩම් අක්කර දහය අක්කර අටක් වුණා. ඒක ඒ තරම් කාරණයක් නොවෙයි. අක්කර අට අක්කර හයක් වුණා. අක්කර හය අක්කර පහක් වුණා. ඒකත් ඒ තරම් කාරණයක් නොවෙයි. ඊළඟට මොකද වුණේ? අක්කර පහ අක්කර හතරක් වුණා. හතර තුනක් වුණා. තුන දෙකක් වුණා. දෙක එකක් වුණා. අගලවත්තේදී දැන ගත් නිසා, එක භාගයක් වී තිබෙන බවත් මා භය නැතිව කියනවා.

මෙසේ වන්නට කාරණය මොකක්ද? මම කාරණය කියන්නම්. ඉඩම් දීමේ ප්‍රතිපත්තිය හා ක්‍රමය ආණ්ඩුව විසින් නියම වශයෙන් සකස් කරන ලද්දක් නොව, ජනතාවගේ ක්‍රියා පිළිවෙළකට මුහුණ පෑම සඳහා ලේසිම විධියට සකස් කිරීමක් වුණා. පසුගිය මහා යුද්ධ කාලයේදී සහ ඉන් පසුව කවුරුන්වත් වැඩිපුර හිත නොදෙන එක්තරා ජනතා ව්‍යාපාරයක් ඇති වුණා. "ස්පොන්ටේනියස්" නමින් ඉංග්‍රීසියෙන් වචනයක් තිබෙනවා. ඉතින් ඒ "ස්පොන්ටේනියස්" විධියට ජනතාව ඒ ව්‍යාපාරය පටන් ගත්තා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
සිය කැමැත්තෙන්.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
මට ආධාර කිරීම ගැන මා ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

කාගේවත් සංවිධානයක් නොමැති, කාගේවත් නායකත්වයක් නොමැති ව්‍යාපාරයකට මේ රටේ ගම්බද ජනතාව සිය කැමැත්තෙන් ඉදිරිපත් වී ක්‍රියා කළා. ඇත්තෙන්ම ජනතාව විසින් ඇති කර ගන්නා ලද ව්‍යාපාරික ගතියක් දරණ තත්ත්වයක් තමයි, ආණ්ඩුවේ ඉඩම් ඇල්ලීමේ ව්‍යාපාරය. මා සෑම පෙර පෝය දිනකම නොවරදවාම අගලවත්තේ මගේ කාර්යාලයට යනවා. අගලවත්තේ මගේ ඡන්දදායකයින්ට මාව හමුවීමේ පහසුව ඇති කිරීමටයි මා එසේ යන්නෙ. මෑතකදී කවදාවත් මගේ නිවසට නොපැමිණි කෙනෙක් බලපිටිය කොට්ඨාශයට ගොස් "හා, අගලවත්තේ මන්ත්‍රීතුමාව හමු වෙන්න අගලවත්තේ මිනිසකු එතුමාගේ නිවසේ දවස් තුනක් සිටියා" ය කියා ප්‍රකාශයක් කර තිබෙනවා. ඕවා එතරම් දේවල් නොවෙයි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
මැතිවරණය කාලෙ වෙන්න ඇති.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
අතුරු මැතිවරණවලදී හෝ මහා මැතිවරණවලදී හෝ කවුරුවත් බොරු කීම හරිය කියා මා පිළිගන්නේ නැහැ. නමුත් ඒ ක්‍රමය හරිය කියා ගරු මුදල් ඇමතිතුමා සිතනවා නම් මගෙන් වරදක් නැහැ. නමුත් මගේ දේශපාලනය ඒක නොවෙයි. මගේ දේශපාලනය බොරුව මොකක්ද කියා ජනතාවට පෙන්වා දී, හරි මාර්ගය සකස් කර දීම මිස බොරුවට බොරුව කීම නොවෙයි. ඒක අමතක කරන්නට මා කියන්නට සැදුවේ මේකයි. මා ඒ අගලවත්තේ මගේ කාර්යාලයට ගියාම සාමාන්‍යයෙන් ඒ දවසට මිනිසුන් පනහක්, සියයක්, එකසිය පනහක් මාව හමු වෙන්නට එනවා. නොයෙක් කරුණු ගැන සිත දී විස්තර අරගෙන මන්ත්‍රීවරයකුගෙන් කෙරෙන්නට තිබෙන යුතුකම් වල යෙදෙන්නට මට ඒ අවස්ථාවලදී සිද්ධ වෙනවා. මාව හමු වෙන්නට ඒ එන්නාවූ ජනකායෙන් අඩු වශයෙන් සියයට 60 ක්ම නගන අදෝනාව පටන් ගන්නේ මෙහෙමයි: "මම අනවසරයෙන් ආණ්ඩුවේ ඉඩමක වගා කළා" "අනවසරයෙන්"—ඇත්තටම මට මේ වචනයත් හොඳට පුරුදු වුණේ එහෙන්. "මම අනවසරයෙන් ආණ්ඩුවේ ඉඩමක් වගා කරනවා" ය කියනවා. ඉතින් ඊළඟට කියන්නේ "මට ඒ ඉඩමට දැන් දිසාපතිවරයාගෙන් අවසර පත්‍රයක් ලබා දෙන්න" ය යන්නයි. එවැනි අවස්ථාවල දී ගම්බද ප්‍රදේශ නියෝජනය කරන ඕනෑම මන්ත්‍රීවරයකුගේ යුතුකම එය ලබා දීමට වැඩ කිරීමයි.

මේ තත්ත්වය ඇතිවුණේ කොහොමද? අගලවත්ත කොට්ඨාශයේ ආණ්ඩුවේ අවසර පත්‍ර ලබා ගෙන දැනට ආණ්ඩුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]
ඉඩම්වල පදිංචිවී සිටින්නාවූ ජනකාය ගෙන් විශාල පිරිස—වැඩි පිරිස—මුලින් අනවසරයෙන් ආණ්ඩුවේ ඉඩම් අල්ලා ගත් උදවියයි. එපරිද්දෙන්ම බලපත්‍ර නැති ව දැනට එම කොට්ඨාශයේ ආණ්ඩුවේ ඉඩම් අල්ලා ගෙන වගා කරන උදවිය ආරක්ෂා කිරීමට, ඔවුන්ට බලපත්‍ර ලබා දීමට කටයුතු කිරීමට අගලවත්තේ දැන් සිටින මන්ත්‍රීවරයා නම් බැඳී සිටින බව මා කියනවා. මා මේ පෙන්වා දීමට උත්සාහ කරන්නේ ඩී. එස්. සේනානායක මැති තුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය නුහුරට ගිය සැටියි. ජනතාව මේ විධියට රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගන්නට පටන් ගත්තා. එමනිසා සෑම ආණ්ඩුවකටම ප්‍රශ්නයකට මුහුණපාන්නට සිද්ධ වුණා. රටපුරා තිබෙන ආණ්ඩුවේ ඉඩම්වලට පැනපු මේ විශාල සේනාව, මේ විශාල ගම්බද ජන කාය නීත්‍යනුකූලව මහේස්ත්‍රාත් උසාවිවල ට ගෙන ගොස් ඔවුනට විරුද්ධව ක්‍රිමිනල් නඩු පවරා, දඩ ගස්වා ඔවුන් ඒ ඉඩම් වලින් පන්නා දමන්නට උත්සාහයක් කරනවාද, නැත්නම් ඒ අනුව තමන් හැඩ ගැසෙනවාද යන ප්‍රශ්නය මතු වුණා. මගේ විශ්වාසයේ හැටියට නම් මේ රටේ කුමන ආණ්ඩුවක් හෝ ඒ සා විශාල ජනකා යකට විරුද්ධව ක්‍රිමිනල් නඩු දමා ඔවුන් වැරදිකරුවන් කර ඒ ඉඩම්වලින් පන්නන්නට තැත් කළා නම් මේ රටේ ගම්බද ජනතාවගේ කැරළි කෝලාහල සහිත විශාල නැගිටීමක් ඇති වෙනවා. මෙ වැනි තත්ත්වයක් ඇතිවීමට හේතුවත් මතක තබා ගන්නට ඕනෑ.

ඇයි මේ විධියට ජනතාව ආණ්ඩුවේ ඉඩම්වලට පැන්නෙ? රටේ ඉඩම් නැති ජනතාවගේ ප්‍රශ්නය දිනෙන් දිනම උග්‍රවී ගිය නිසයි. ඉඩම් අගලක්වත් නැති ගම්බද ජනතාවගේ ප්‍රමාණය දිනෙන් දිනම වැඩි වුණා. එක පැත්තකින් තිබුණු ඉඩම් කැබැල්ල වෙන කවුරුවත් ලබා ගැනීම නිසා ඉඩම් නැති ජනතාවගේ සංඛ්‍යාව වැඩි වුණා. අනෙක් පැත්තෙන් ජනගහණ ය වැඩිවුණා. අළුතෙන් ඇති වන පරම්පරා වට ජීවත් වෙන්නට විධියක් තිබුණේ නැහැ. රක්ෂාවකුත් නැහැ. ගොවිතැනක් කරන්නට ඉඩම් කැබැල්ලකුත් නැහැ. එම නිසා ඔවුන්ට ආණ්ඩුවේ ඉඩමක් අල්ලා ගෙන ඒකට පැනීම මිස, ජීවත් වෙන්න ට වෙන මාර්ගයක් තිබුණේ නැහැ. ඔවුන්ට ජීවත් වන්නට වෙන විධියක් තිබුණේ නැහැ. කොහෙන් හරි ඉඩමක් අල්ලාගෙන ඒකට පැනීම මිස වෙන විධියක් ඔවුන්ට ඉතිරිව තිබුණේ නැහැ. මා සාධාරණව කනගාටුවෙන් කියනවා, එක කාරණයක්. ඉඩම් ප්‍රශ්න ගැන නිතර නිතර ඝෝෂා කළ මේ රටේ එකම ආණ්ඩුවකටවත්, හේතූන් කීපයක් නිසා, ඉඩම් නැති ජනතාව අතර ක්‍රමානුකූලව ඉඩම් බෙදා හරින්නට හැකියාවක් තිබුණෙ නැහැ. යම් ඉඩමක් ක්‍රමානුකූලව බෙදා දෙන්නට නම් ඒ ඉඩම කොහේ පිහිටා තිබෙනවාදැයි පළමුව සොයා ගන්නට ඕනෑ. ඊළඟට එසේ දෙන ඉඩමේ මායිම් දැනගන්නට ඕනෑ. අනතුරුව එය මනින්නට ඕනෑ. මැන්නා යින් පසු එහි සීමා මායිම් ලකුණු කරන්න ට ඕනෑ. ඊළඟට එය බෙදා දෙන ක්‍රමය කච් චේරිය මගින් සකස් කරන්නට ඕනෑ. අන්තිමේ ඉඩම් කච්චේරියක් තියන්නට ඕනෑ. ඔය ආකාරයට නොයෙකුත් දේ කර අන්තිමේදී තමයි ඉඩමක් බෙදා දෙන්නේ. ඊළඟට, ඒ ඉඩම වගා කිරීමේදී ආණ්ඩු වෙන් එය පාලනය කිරීම සඳහා ඉතාමත් දියුණු පුළුල් පාලන ක්‍රමයක් ක්‍රියාවට යෙදී ම අවශ්‍යව තිබුණා. ඒ සෑම දෙයක් ගැනම කල්පනා කර බැලුවායින් පසු මා ඉතා කන ගාටුවෙන් එක්තරා කාරණයක් සඳහන් කරන්නට ඕනෑ. ඉඩම් සංවර්ධන දෙපාර්ත මේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තු ව වැනි දෙපාර්තමේන්තු සියල්ලක්ම එකතුකොට කල්පනා කර බැලූ විට ඒවායින් කෙරෙන වැඩ පිළිවෙළ මේ රටේ පැනනැගී තිබුණු අවශ්‍යතාවයනට ප්‍රමාණ වත් නොවුණු බව කියන්නට ඕනෑ. එසේ හෙයින් යම් ඉඩමක් වුවමනා වූ කල ජනතාව ඒ ඉඩම අල්ලා ගත්තා. අනික් වැඩ පස්සේ ආණ්ඩුවෙන් කෙරෙන තුරු පළමුව ඔවුන් ඉඩම අල්ලා ගත්තා. එම නිසා මේ ආකාරයට ජනතාව ගත් පියවර පස්සේ යමින් ඒ ජනතාව කළ දෙය පුළු වන් නම් නීත්‍යානුකූල තත්ත්වයට ගෙනෙන්නට ආණ්ඩුවට සිදු වුණා. මේ අන්දමට එක මිනිහෙක් අක්කර 4ක් ඇල්ලුවා. තව මිනිහෙක් අක්කර 2ක් ඇල්ලුවා. තව කෙනෙක් අක්කර 1/2ක් ඇල්ලුවා. තවත් කෙනෙක් ආණ්ඩුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැලෑවකට පැන පොඩි ඉඩම් කොටසක් අල්ලා ගත්තා. මෙම ඉඩම්වලින් ඔවුන් පිටමං කරන්නට බැරි නිසා, රජයට සිදු වුණා ක්‍රමානුකූලව රෙගුලාසි හදන්නට. මේ ඉඩම් සංවර්ධන ඇමතිතුමාම මට අගලවත්තේ සිට වැදගත් විධියට පාවිච්චි කිරීම සඳහා එසේ සකස් කළ රෙගුලාසි පෙළක් දීලත් තිබෙනවා. මේ අන්දමට මේ රටේ පොඩි ඉඩම් කැබෙලිත් බෙදා දෙන්නට නීති සකස් කරන්නට ආණ්ඩුවට සිදු වුණා. ඒ ගැන සිහිපත් වන විට ඉතා කන ගාටුවෙන් එක කාරණයක් සඳහන් කරන්නට කැමතියි. ආණ්ඩුවෙන් මේ විධියට ඉඩම් බෙදා දීමට ක්‍රම සකස් කිරීම නිසා අපේ රටේ පිහිටි හොඳ සරුසාර බිම් විශාල අන්දමින් නාස්ති වන පිළිවෙළට වගා කටයුතු ආරම්භ වී තිබෙනවා. එය වෙනම ප්‍රශ්නයක්. එම නිසා ඒ ගැන මා මෙහිදී සඳහන් කරන්නට යන්නේ නැහැ. රෙසවේෂන්—reservation—කියන වචනය ගැන අප දන්නවා. අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) හරි ඉංග්‍රීසි වචනය stream reservation බව කියනවා. රෙසවේෂන් කියන වචනය දැන් සිංහල වෙලා. අගලවත්තේ නම් කිසිම ගොවියෙක් ඇවිත් ඔය වචනය හැර වෙන වචනයක් පාවිච්චි කර නැහැ. රෙසවේෂන් එකක් කියලයි කියන්නේ. එච්චර ලස්ස නට එම වචනය ඒ අය කියන්නේ නැහැ. ඒ උදවිය එම වචනය එක එක අන්දමට කියනවා. කිසි අනුමානයක් නැතුව තව අවුරුදු 10ක් යන විට ඒ වචනය "රෙසෙෂන්" එකක් වේ වී. දැන් මේවාටත් පැනලා වගා කරන බව අපි දන්නවා. අන්තිමේදී මේකට මොකක්ද වන්නේ කියා තීන්දු කරන්නේ පහළම සිටින ඩී. එල්. ඕ. මහතා සහ ගම්මුලාදෑනි මහතායි; කච්චේරිය නොවෙයි.

මා දැන් ඊට වඩා වැදගත් ප්‍රශ්නයක් ගැනයි කතා කරන්නේ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට සිදු වුණා, මෙසේ ඇති වුණු සිද්ධීන් මාලාව පිටුපසින් ගමන් කරන්නට. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒ අනුව අර ඉඩම් බෙදීමේ මූලික ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් වෙනස් කරන්නට සිදු වී තිබෙනවා. මේක පුදුමයක් නොවෙයි. නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් කොමිසම විසින් 1958දී ප්‍රසිද්ධ කළ වාර්තාව මා ළඟ තිබෙනවා. මා දැන් ඒ වාර්තාව බලාගෙන යන විට මට හදිසියෙන් කියවන්න ලැබුණ ඡේදයක් කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමතියි. එය මෙහි 150 වෙනි පිටුවේ 399 වෙනි ඡේදයයි. මෙම ගරු සභාව මට සමාවෙනවා ඇති, 1947දී මා මෙම ගරු සභාවට මුලින්ම පත් වී පැමිණි අවස්ථාවේදී ඉඩම් ප්‍රශ්නය ගැන මුලින්ම මා කළ කථාවේදී මතක් කළ අඩු පාඩුව ආණ්ඩුවේ කොමිෂන් සභාවක් විසින් එම වචනවලින්ම වාගේ මෙහි සඳහන් කර ඇති බව අවුරුදු 21කට පසුව පෙන්වා දීමට සිදුවීම ගැන. මා එය මෙහි සඳහන් හැටියට ඉංගිරිසියෙන් කියවා, ඊට පසු මට පුළුවන් විධියට සිංහලට පෙරළන්නම්.

"The Commission is of the opinion that the first essential in any study of colonization is to clarify its aims."

ජනපද යෝජනා ක්‍රම පිහිටුවීම ගැන පරීක්ෂා කරන විට මුලින්ම අත්‍යවශ්‍ය වන්නේ මොන කරුණක් සඳහා මොන අරමුණක් සඳහා ඒ ජනපද ඇති කරන්නේද යන කාරණා පැහැදිලි කර ගැනීමයි.

"It is a legitimate matter for criticism that food production"—

අද තිබෙන විශෙෂ දර්ශනය තමයි ඒ.

—"the relief of unemployment and the relief of landlessness and over-population have been confused in the planning and organization of colonization schemes."

මෙවැනි කොමිෂන් සභාවක් විසින් වාර්තා කරන විට කාගේවත් හිත නොරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

දෙන විධියට කී දෙයක් මමත්, එසේ හිත නොරිදෙන විධියටම, සිංහලට පෙරළන්න ට උත්සාහ කරනවා. මෙවැනි ජනපද ව්‍යාපාර ඇති කරන විට ඒ සැලැස්ම හදන්නවුන්ගේ සිත් කරුණු 4 ක් නිසා අවුල් වී තිබෙන බව අපට ඔප්පු වී තිබෙ නවා. මොනවාද ඒ කරුණු 4 ?

"food production"

ආහාර වගාව ;

"the relief of unemployment"

රැකී රක්ෂා නැතිකමට සහනයක් දීම ;

"the relief of landlessness"

රටේ ඉඩම් නැති කමට සහනයක් දීම ;

"the relief of over-population"

රටේ ප්‍රමාණයට වඩා, තරමට වඩා, ජනතාව වැඩි වීමෙන් ඇතිවන තත්ත්ව යට සහනයක් දීම.

ජනපද හැදුවාම ජනපද නුහුරට යන් නේ මේ කරුණු 4 අවුල් කරගෙනමයි. ඒක ඇත්තයි. ඒක ඇත්ත බවයි මෙහි සඳහන් වෙන්නෙ. මේක විශාල ඇත්තක්, නියෝජ්‍ය සභාපතිතුමනි. විශාල ඇත්තක් බව මට ඔප්පු කරන්න අමාරුවක් නැහැ.

අපට වුවමනා කරන්නේ වගාව දියුණු කරන්න නම්, අප සෙවිය යුතුයි, ඒ ඒ ගොවියාට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ගැන. සෑම ගොවියෙකුටම එකම ඉඩම් ප්‍රමාණ යක් අවශ්‍ය නැහැ. ලූනු වගා කරන කෙනෙකුට අක්කර භාගයක් තිබුණොම ඇති. රබර් වගා කරන කෙනකුට අක්කර 8ක් හෝ 10ක් තිබිය යුතුයි කියා මගේ විශ්වාසයක් තිබුණත් අක්කර 4ක් ඇත කියා ආණ්ඩුව හිතන බව මා දන්නවා. තේ වගාව නම් ඒ විධියට තිබෙන්න ඕනෑ. එක එක වගාවට එක එක පළාතේ හැටියට එක එක ඉඩම් ප්‍රමාණය ඕනෑ. තුවත් ඒ ඒ පළාතේ බිම්වල හැටියට, ඒ ඒ පළාතේ දේශගුණයේ හැටියට, ඒ ඒ ප්‍රදේශයේ පරිසරයේ හැටියට මොන වගාවක් සුදුසුද කියාත් තීන්දු කරන්නට ඕනෑ. ඔය දෙක එකතු කරමින් එවැනි පළාතක, එවැනි තැනක, එවැනි වගාවක් කාර්යක්ෂම විධිය ට කරන්නට පුළුවන් ගොවීන් සොයාගෙන එහි පදිංචි කරවීමයි, වගාව දියුණු කිරීම සඳහා පිහිටුවන ජනපද ක්‍රමයක මාර්ගය විය යුත්තේ. වෙන විධියක් නැහැ. එහෙම නැතුව අපේ බලපිටිය ගමේ ඉඩමක් නැති මිනිහෙකු එක්ක ගිහින් උඩවලවේ ව්‍යාපාර යෙන් අක්කරයක් දෙකක් දීල පදිංචි කර වල, උඹ මේක වවාපන් කිව්වට, ඒ අරමුණ නම් ඉෂ්ට වෙන්නෙ නැහැ. එහෙත් බලපිටි ගමේ සිටින ඉඩම් නැති මිනිහාගෙන් අතුරු මැතිවරණයේදී ඡන්දය ඕනෑ නම් ඒක හරි. ඒ වගේම බලපිටි ගමේ ඉඩම් නැති මිනිහාට ඉඩම් නැතිකමට සහනයක් දීමට ඕනෑ නම් ඒක හරි. බලපිටි ගමේ ජනතාව එහි ආර්ථික තත්ත්වයට වැඩි වී තිබීම හේතුකොටගෙන එහෙම කරනවා නම් ඒකත් හරි. එහෙත් මම අන්තිමට සඳහන් කළ තුන් ක්‍රමයට වගාව දියුණු කරනවාය කිව්වොත් ඒක වැරදියි.

මම මේ කථා කරන්නේ ආහාර හා කෘෂිකර්ම වගාව ගැන මිස දේශපාලන වගා ව ගැන නොවෙයි. මේවා මිශ්‍ර කරගෙන ඉඩම් ප්‍රතිපත්තිය ගෙන යන්න බැහැ. තමන් අවුරුදු 12ක් තිස්සේ ගෙන ගිය ක්‍රියා පිළිවෙළ ගැන කල්පනා කර බැලුවා ම, "මම මෙතෙක් ඉඩම් ප්‍රතිපත්තිය ගෙන ගියේ අවුල් අරමුණු ඇතිවයි" කියන කාරණය ගරු ඇමතිතුමාටම පිළිගන්නට සිදු වෙනවා නේද කියා ගරු ඇමතිතුමා ගෙන් මා ප්‍රසිද්ධියේ අහනවා. හැබැයි, එය කරන්නට ඇත්තේ හොඳ හිතින් වන්න ට පුළුවන් බව මා නැවතත් කියනවා. හොඳ හිතය කිව්වාමත් කාට හොඳද, කොයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිතද, කියන ප්‍රශ්නත් එන නිසා මා ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ආණ්ඩුවෙන් ඉඩම් ලැබී තිබෙන අයගේ සංඛ්‍යාව විශාල ලෙස වැඩි වී තිබෙන බව ඇත්තයි. එහෙත් ගත වූ අවුරුදු 12 තුළ ප්‍රමාණවත් ලෙස ඉඩම් ලැබුණු අයගේ සංඛ්‍යාව අඩු බවත් ඇත්තයි. එවිට මෙතැන ප්‍රශ්නයක් එනවා. ඒ ගැන මතක් කිරීමෙන් පසුව තමයි, මේ අළුත සකස් කර තිබෙන සංශෝධනය හරිද, ප්‍රමාණවත්ද, කියා තීන්දු කරන්ට පුළුවන් වෙන්නෙ. සාමාන්‍යයෙන් ජනපදවල වාසය කරන ගොවි පවුල් දෙස බැලුවාම ඒ පවුල්වල හත්-අට දෙනා, දහ-දොළොස් දෙනා සිටින බව පෙනී යනවා. එවැනි පවුලකට අක්කර 10 ක් තිබුණත් එයින් ලබාගත හැකි ආදායමෙන් ඒ පවුල්වල දරුමල්ලන් එක්තරා වයසකට පත් වුණාට පසු ඔවුන්ගෙන් වැඩි දෙනාට යැපෙන්නට බැහැ. දෙමව්පියන් සිටින තුරු, බාල ළමයින් සිටින තුරු, වැඩිමහල් පුත් දූවරුන්ට එයින් රැකෙන්නට බැහැ. ආදායම මදි. අක්කර අට-දහය, අක්කර පහ-හය කෙසේ වෙතත්, අක්කරය දෙක, බාගය හමාර තිබෙන අයට නම් එයින් රැකෙන්නට බැරි බව පැහැදිලියි. මේ අනුව ඉඩම් සංවර්ධනය නමින් සිදු වන්නේ මේ රටේ දුප්පත්කම පතුරුවා හැරීම විතරයි. හොඳ හිතකින් කළත් මෙයින් සිදු වන්නේ දුප්පත් ගොවීන් විශාල වශයෙන් වැඩි කිරීම පමණයි. මිනිහෙකුට අක්කර භාගයක් තිබීම කොහෙත්ම නැතිව යෑමට වඩා හොඳයි. රක්ෂාවක් නැතිව ඉන්නවාට වඩා කොහේ නමුත් කැලෑවක අක්කර භාගයක හෝ කුරු ගෑම හොඳයි. මේ රටේ ඉතිරි වී තවත් ඇතැයි කියන අක්කර අට ලක්ෂයක් තරම් වූ ඉඩම් ප්‍රමාණය මේ ක්‍රමයටම තව අවුරුදු 45ක් 50ක් පාවිච්චි කරගෙන ගියොත් සම්පූර්ණයෙන්ම ඉවර වන තැනට එන බව මේ කොමිෂන් සභාවම කියනවා. මේ ක්‍රමයට මේ රටේ ඉඩම් සංවර්ධන ක්‍රමය තව දුරටත් ගෙන ගියොත් අපේ රටට ගැලවෙන්නට බැරි වෙනවාය කියනවා. වගා ව්‍යාපාරයෙන් නොවෙයි, වගා කරන්නට සුදුසු ඉඩම් නැති වීමෙනුයි එය සිදු වන්නේ. මා මෙසේ කථා කරන්නේ ආශාවකට එහෙම නොවෙයි. මේවා නිකම් සෙල්ලමකට එහෙම කියනවාත් නොවෙයි. නිකම් වැරදි සෙවීමට කියනවාත් නොවෙයි. තම රටේ ඉන්නාවූද, අද සහ හෙටත් අනාගතයේදීත් ඇති වන්නට සිටින්නාවූද පරම්පරාවලට අපෙන් ලැබිය යුතු දායාදය ගැන කල්පනා කරනවා නම් රටටත් අපේ මතු පරම්පරාවලටත් අප තුළ අල්ප මාත්‍රයක හෝ ආදරයක් එහෙම ඇත්ත වශයෙන්ම තිබෙනවා නම්, අපි පමණක් අද හොඳට කා බී මැරෙන්නට බලාපොරොත්තු වන්නේ නැත්නම්, මගේ විශ්වාසයේ හැටියට අපේ රටේ තිබෙන අනෙක් සියලුම මූලික ප්‍රශ්නවලට වඩා මූලික ප්‍රශ්නය මේ ඉඩම් සංවර්ධන ප්‍රශ්නයයි. ඒ නිසයි මා අද කථා කරන්නට තීරණය කෙළේ.

අමුතුවෙන් මතක් නොකර, වෙනත් සහෝදර මන්ත්‍රීවරුන් මතක් කළ අදහසකින් තව දුරටත් යමක් පැහැදිලි කරන්නට මා අදහස් කරන්නේ වෙන අංශයකිනුයි. මහියංගන පළාතේ අක්කර දහස් ගණනක් කොම්පැනිකාරයන්ටත්, මහා ධනපතියන්ටත් වගාවට දී තිබෙනවා. ඔවුන් ඒවායේ කැලෑව කපා පුළුවන් ඉක්මනින් මැෂින් යොදා එළි කර තිබෙනවා. වුවමනාවක් නැත්නම් ඒ ඉඩම්වල ඉතිරි වැඩ අල්ලලා දමන්නටත් ඒ අයට ඉඩ දී තිබෙනවා. මෙතන ප්‍රශ්නය එය නොවෙයි. මේ ලොකු ප්‍රශ්නය ගැන මා කියන්නේ පුංචි ඉඩම් ප්‍රශ්නයටත් මෙය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

අයිති නිසයි. මේ කැලෑවල් මොනවාද? ශතවර්ෂ ගණනාවක් තිස්සේ හැදීගෙන පැවතීගෙන ආ මේ කැලෑවල් තිබීම හේතු කොටගෙන ඒවා ඇති පළාත් සහ ඒ බිම් එක්තරා ප්‍රමාණයක සරු ගතියක් ඇති ඒවා හැටියට පවතිනවා. ඇත්ත වශයෙන්ම ඒවායේ සරු ගතියක් තිබෙනවා. කැලෑ වශයෙන් තබා ගන්නට වුවමනා නම් කැලෑ පාලනය කිරීමේ මූලික ප්‍රතිපත්තිය කුමක් වත් නොවෙයි, මෙයයි. ගහක් කපනවා නම් ඒ වෙනුවට ගහක් එතැන හිටුවන්නට ඕනෑ. අපි නම් ගස් කපනවා. කපා හිටුවන්නේ නැහැ. දෙවැනි කාරණයකුත් තිබෙනවා. කැලෑ කපන විට පොළොව සෝදා පාළුවට යනවාදැයි කල්පනා කරන්නට ඕනෑ. වගා නාමයෙන් අපේ පැරණි කැලෑවල් කපා, නිසි විධියේ වගා ක්‍රමයකුත් නැතිව මේවා නිකම් වගා කිරීමේ නාමයෙන් අරකයි, මේකයි අනෙක් එකයි යනාදි වශයෙන් තාවකාලික වශයෙන් වැඩ කිරීමේ ක්‍රමයෙන් අවුරුදු දහයක් විස්සක් යන විට මහියංගන පළාතේ වගාවට සුදුසු පොළොවක් ඉතිරි වෙයිද? වගාකිරීමට අවශ්‍ය තත්ත්වය තිබෙන්නේ අඟල් නවයක් යන තෙක් පමණයි. ඊට වඩා යට පොළොව පාවිච්චි කරමින් වගා කරන්නට වුවමනා නම් අලුතින් නීති රීති දමා මේවා පාලනය කරන්නට පටන් ගන්නට වෙයි.

එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1969 ජනවාරි 4 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது. 1969, ஜனவரி 4, சனிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Saturday, 4th January, 1969.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:

" මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය ".—[ගරු සී. පී. ද සිල්වා].

" சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக " [கௌரவ சீ. பி. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

" That the House do now adjourn ".—[*The Hon. C. P. de Silva*].

**නීල් ද අල්විස් මයා. (බද්දේගම)**
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

I have a question to ask of the hon. Parliamentary Secretary to the Minister of Justice. I refer to M.C. Panadura Case No. 13326. I would request the hon. Parliamentary Secretary, if necessary through the Attorney-General, to call for this record and the Information Book extracts and see whether the steps taken against this public servant were justifiable at all or whether this man was harrassed for some other reason and, if so, that the matter be handed over to the authorities for necessary disciplinary action against all those concerned.

The police, you know, act improperly in certain matters and this is a case where a public servant has not been given a fair chance to explain a charge that has been brought against him. There was a statement that was made, the statement was not corroborated, the man was unnecessarily remanded and later on no action was taken by the police.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අකුරැස්ස ආසනයේ මාලිම්බඩ මහා විද්‍යාලයේ ශිෂ්‍යයකුට කර තිබෙන හිරිහැරයක් සම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බන්ධව මා ඇමතිතුමාට කල් ඇතිව දනුම් දුන්නා. ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ මෙහි නැතත් ඒ කරුණ ගරු සභාවට මතක් කළ යුතුව තිබෙනවා.

මාලිම්බඩ මහා විද්‍යාලයේ දුප්පත් ශිෂ්‍යයෙකුට කර ඇති හිරිහැරයක් ගැනයි මා සඳහන් කරන්නේ. ඔහුගේ පියා ක්ෂය රෝගය සෑදී ආරෝග්‍ය ශාලාවකයි සිටින්නේ. ඔහුගේ මව අංගොඩ සිටින මානසික රෝගියෙක්. මේ තරුණ ශිෂ්‍යයා ආහාර නැතිකම නිසා හාමතෙන් පාසැලට පැමිණ පාසැල් ඉඩමෙන් වැවර ගෙඩියක් කඩා ගෙන බඩගින්නට එය කාලා තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
අවසර ඇතිවද? නැතිවද?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

බඩගින්න ඇති වුණාම අවසරයක් ඕනෑ නැහැ. මේ ඉඩම බදු අරගෙන තිබෙන්නේ එම පාසැලේ මුල්ගුරුවරයාමයි. ඒ නිසා තමන්ගේ දේපොළ ප්‍රවේසම් කර ගැනීමේ ප්‍රධාන වුවමනාවෙන් මේ ශිෂ්‍යයාගේ අත් දෙක පිටිපස්සට කර බැඳ හුඟ වේලාවක් පාසැලේම රඳවා ගෙන සිට පසුව පොලිසියට අරගෙන ගියා. තවත් ළමයින් තුන් දෙනෙක් කැඩූ වැවරත් පොලිසියට අර ගෙන ගියා. අනික් ළමයින් තුන් දෙනාගේ මව් පියන් බලපුළුවන්කාර අය නිසා ඔවුන් මේ හොරකමට අල්ලා ගත්තේ නැහැ. පොලිසියේදී එම මුල් ගුරුවරයා අර ශිෂ්‍යයාට වැවර ගෙඩි 4 ම නොනවත්වා එක දිගටම බොන්නට සලස්වා තිබෙනවා. පොලිසියේ උසස් නිලධාරීන් එයට සම්බන්ධ වී නැහැ. දිළිඳු අහිංසක ළමයකුට ඒ අන්දමට පාසැල් ඉඩමේ වැවර ගෙඩියක් කඩාගෙන කෑමේ වරදට අමනුෂ්‍ය විධියට හිරිහැර කළ මුල් ගුරුවරයෙක් එවැනි තනතුරක තැබීමට සුදුසුද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. හොරකම වැරදියි. වැවර ගෙඩියක් වුණත් හොරෙන් කෑමට අනුබල දිය යුතු නැහැ. එවැනි දේ වලට උනන්දු කිරීම සුදුසු නැහැ. එහෙත් දුප්පත් ළමයෙක් හොරෙන් වැවර ගෙඩියක් කඩාගෙන කෑවොත් ඒ [illegible] අන්දමට ඒ ළමයා හොඳ මාර්ගයේ ගෙන යෑමට හේතු වන යම් ක්‍රියා මාර්ගයක් ගන්නවා මිස පොලිසියට ගෙන ගොස් මේ අන්දමට හිරිහැර කොට වැවර ගෙඩි 4 ක් එක වරට බොන්නය කීම මුල් ගුරුවරයකුට ඔබින්නේ නැහැ. යුද්ධ කාලයේදී ෆැසිස්ට්වාදීන්ගේ තිබුණ "වෝටර් ටෝචර්" කියා වතුර විදීමෙන් හිංසා කිරීමේ ක්‍රමයක්. ඒ අන්දමට මේ ළමයාටත් හිංසා කිරීමට වැඩ පිළිවෙළක් යෙදීම නිසා මේ විද්‍යාලයාධිපතිතුමාගේ මේ අමානුෂික ක්‍රියාව සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පාසැලක ළමයින් සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වූ විට පොලිසියට ගෙනයෑමට කිසිම වුවමනාවක් නැහැ. ළමයින් අතර විනය කඩ කිරීමේ වැඩ පිළිවෙළක් ඇති වන විට ඒවා ගැන සොයා බලා ඒ ශිෂ්‍යයන් නියම අන්දමට හරිමඟ ගමන් කරවීමට කටයුතු කිරීමයි මුල් ගුරුවරයකුගෙන් ඉටු විය යුත්තේ. ඒ කට යුත්ත කළ යුත්තේ ඔය අන්දමට නොවෙයි කියා අපි පිළිගන්නට ඕනෑ.

මේ විදුහල්පතිතුමා විසින් ළමයින්ගෙන් මුදල් එක්කාසු කර ගෙන නියම අන්දමට ගණන් හිලව් දෙන්නේ නැතිව නීති විරෝධි අන්දමින් කටයුතු කරන බවත් මේ ප්‍රශ්නය සම්බන්ධව කරුණු සොයා බැලීමේදී මට දැනගන්නට ලැබුණා. ඒ නිසා ඒ කාරණය සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය ගැන අපි සොයා බැලුවා. නමුත් අපට දැනගන්න ලැබුණ හැටියට ඒ ප්‍රදේශයේ අධ්‍යාපන කාර්යාලයට ඒ සම්බන්ධ කිසිම පැමිණිල්ලක් ලැබී නැහැ. කිසිම කෙනෙකුගෙන් ඒ සම්බන්ධ පැමිණිල්ලක් ලැබී නැති බවයි අපට දැන ගන්න ලැබුණේ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ මාර්ගයෙනුත් අපි මේ ගැන සොයා බැලුවා. නමුත් එම කාර්යාලයට මෙවැනි පැමිණිල්ලක් ලැබී නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
බවයි අපට දැනගන්න ලැබුණේ. ඒ නිසා එවැනි දෙයක් සිදු වුණා නම් ඒ ළමයා ගේ දෙමව්පියන් විසින්——

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
මවත් පියාත් දෙදෙනාම ආරෝග්‍යශාලා වෙයි. මේ ළමයා අනාථ ළමයෙක්.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඒ ළමයාගේ කවුරු හරි භාරකරුවෙක් සිටිනවා නම් ඔහු විසින් මේ ගැන පැමිණිල්ලක් කළොත් අපට මේ ගැන පරීක්ෂා කර බලන්න පුළුවනි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
මම විස්තර ඉදිරිපත් කරන්නම්.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

This being the last Sitting of the House for this year, I wish all hon. Members a very happy Christmas and a prosperous New Year.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.08 ට 1969 ජනවාරි 4 වන සෙනසුරාදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி சபை பி. ப. 7.8 க்கு, 1969 ஜனவரி 4, சனிக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 7.8 P.M. until 2 P.M. on Saturday, 4th January 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org